

# 2022

# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# ANNUAL REPORT

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය.

நவீன தொழில்நுட்பவியலுக்கான ஆர்தர் சி. கிளார்க் நிறுவகம்.

Arthur C Clarke Institute for Modern Technologies.

# නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
# වාර්ෂික වාර්තාව 2022

පටුන — පිටු අංකය


1.0 සාමාන්‍ය තොරතුරු 1
1.1 පාලන ව්‍යවස්ථාව 1
1.2 ඉදිරි දැක්ම 1
1.3 මෙහෙවර 1
1.4 පාලනය කරන අමාත්‍යාංශය 1
1.5 පාලක මණ්ඩල සාමාජිකයින් – 2022 2
1.6 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පිළිබඳ කෙටි හැඳින්වීමක් 3
1.7 සංවිධාන ව්‍යුහය 4
2.0 සභාපතිතුමාගේ පණිවුඩය 5
3.0 අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව 6
4.0 ආයතනයේ අංශ 10
5.0 ප්‍රධාන ව්‍යාපෘතිවල කාර්යසාධනයේ විශේෂ අවස්ථා 11
6.0 පර්යේෂණ වැඩසටහන් හා තාක්ෂණ සේවාවන් 15
6.1 කර්මාන්ත සඳහා ආරම්භකර ඇති ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් 15
6.2 ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති 19
6.3 තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති 26
6.4 දුරස්ථ සංවේදනය (RS) හා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති 28
6.5 පර්යේෂණ ප්‍රකාශන 29
6.6 පරීක්ෂා කිරීම් හා මිනුම්, දෘඩකාංග පිළිසකර කිරීම් හා උපදේශන සේවා 29
7.0 පුහුණු, අධ්‍යාපන හා තොරතුරු බෙදාහැරීම 33
7.1 වෘත්තිකයින් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් 33
7.2 මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණ පුහුණු 34
7.3 විද්‍යාව සහ තාක්ෂණය ජනප්‍රිය කිරීම හා තොරතුරු බෙදාහැරීම 35
7.4 ACCIMT පුස්තකාලය 36
8.0 මානව සම්පත් සංවර්ධනය 37
9.0 2022 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන 38
10.0 පසුගිය දස වසර තුළ ආයතනය ලද මූල්‍ය ජයග්‍රහණයන් 62
11.0 සැලසුම්කරන ලද කෙටි හා මධ්‍ය කාලීන වැඩසටහන් 63
12.0 2022 වසර සඳහා විගණන කමිටු වාර්තාව 65
13.0 2022 වසර සඳහා විගණකාධිපති වාර්තාව 67
14.0 2022 වසර සඳහා විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු 73

# 1.0 සාමාන්‍ය තොරතුරු

## 1.1. පාලන ව්‍යවස්ථාව

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT), අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත සංස්ථාවකි. 1984 අංක 30 දරන පනත මගින් පිහිටුවන ලද නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ අනුප්‍රාප්තිකයා ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ 1998 අප්‍රේල් 01 වන දින නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය ස්ථාපනය කර ඇත.

පනතේ දක්වා ඇති පරිදි නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ කාර්යභාරය පහත දැක්වේ:

(අ) ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණය හඳුන්වා දීම වේගවත් කිරීම සඳහා

(i) නවීන තාක්ෂණය අදාල කිරීමෙහිලා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීමෙන්, ප්‍රවර්ධනය කිරීමෙන් හා පවත්වාගෙන යාම මගින් සහ

(ii) නවීන තාක්ෂණය අදාල කිරීමෙහිලා රජයට සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර වලට පර්යේෂණ හා සංවර්ධන සහය සැලසීම මගින් සහ

(iii)රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාරයන්හි අවශ්‍යතාවය පිරිමසාලීම සඳහා නවීන තාක්ෂණ සම්බන්ධයෙන් පුද්ගලයින් පුහුණු කිරීම මගින් දායක වීම සහ

(ආ) අනාගත අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා

නවීන තාක්ෂණ ක්ෂේත්‍රයන්ට සන්නිවේදනය සහ ආශ්‍රිත විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික, අභ්‍යවකාශ තාක්ෂණ, රොබෝ විද්‍යා, ෆොටෝනික්ස් සහ නව ද්‍රව්‍ය ඇතුලත් වේ.

## 1.2. ඉදිරි දැක්ම

නවීන තාක්ෂණය සඳහා කලාපය තුළ ප්‍රමුඛතම නවෝත්පාදන මධ්‍යස්ථානය වීම

## 1.3. මෙහෙවර

දේශීය පදනමක් සහිත නවීන තාක්ෂණික හැකියාවන්, නවෝත්පාදන, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්, පුහුණු, කර්මාන්ත සේවා සහ අන්තර්ජාතික සහයෝගීතා තුලින් සංවර්ධනය හා දිරිමත් කිරීමට පහසුකම් සැලසීම.

## 1.4. පාලනය කරන අමාත්‍යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශය(නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය)

## 1.5. පාලක මණ්ඩල සාමාජිකයින් – 2022

| අංකය | නම | පාලක මණ්ඩලයේ තනතුර | කාලසීමාව | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| 01 | මහාචාර්ය සිසිල් කුමාරවඩු | පාලක මණ්ඩල සභාපති | ජනවාරි | අගෝස්තු |
| 02 | ඉංජිනේරු (ආචාර්ය) සනත් පනාවැන්නගේ | අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි - ACCIMT, පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | දෙසැම්බර් |
| 03 | මහාචාර්ය කේ.පී.එස්. චන්දන ජයරත්න | පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | අගෝස්තු |
| | | පාලක මණ්ඩල සභාපති | සැප්තැම්බර් | දෙසැම්බර් |
| 04 | මහාචාර්ය එන්.ඩී.ගුණවර්ධන | පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | දෙසැම්බර් |
| 05 | මෙරික් ගුණරත්න මහතා | පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | දෙසැම්බර් |
| 06 | රාජිත දහනායක මහතා | පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | දෙසැම්බර් |
| 07 | සුෂේන රණතුංග මහතා | පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | දෙසැම්බර් |
| 08 | යූ. උඩුගහපත්තුව මිය | පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | මාර්තු |
| 09 | මහාචාර්ය ඒ.කේ.ඩබ්.ජයවර්ධන | පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | දෙසැම්බර් |
| 10 | මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා | පාලක මණ්ඩල සාමාජික | ජනවාරි | දෙසැම්බර් |
| 11 | මහාචාර්ය සුදන්ත ලියනගේ | පාලක මණ්ඩල සාමාජික | මැයි | සැප්තැම්බර් |
| 12 | එස්.යූ. චන්ද්‍රකුමාරන් මහතා | පාලක මණ්ඩල සාමාජික | අප්‍රේල් | දෙසැම්බර් |

**2022 වසරේදී පවත්වනු ලැබූ පාලක මණ්ඩල රැස්වීම්**

| පාලක මණ්ඩල රැස්වීම් අංකය | රැස්වීම් පැවැත්වූ දිනයන් |
|---|---|
| 2022/01 | ජනවාරි 25 වන දින |
| 2022/02 | පෙබරවාරි 22 වන දින |
| 2022/03 | මාර්තු 22 වන දින |
| 2022/04 | මැයි 24 වන දින |
| 2022/05 | ජූලි 26 වන දින |
| 2022/06 | සැප්තැම්බර් 27 වන දින |
| 2022/07 | ඔක්තෝබර් 31 වන දින |
| 2022/08 | දෙසැම්බර් 20 වන දින |

## 1.6. ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය පිළිබඳ කෙටි හැඳින්වීමක්

**ඉංජිනේරු (ආචාර්ය) පී. සනත් පනාවැන්නගේ**
PhD, MSc, MBA, CEng., FIE(SL),
MIET(UK)
අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි

**ඉංජිනේරු කමනි එදිරිවීර මිය**
BSc. Eng., CEng., MIE(SL), MPA
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික මෙහෙයුම්)

**ජී.එච්.සී. ජයරාණි මිය**
LLB, AAL., MBASL, MPM
ජ්‍යෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන සහ මානව සම්පත්)

**ආර්.ඒ.එස්.එස්. ගුණසේකර මයා**
BSc, PG Dip., MTech
ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ සහ වැඩබලන අධ්‍යක්ෂ (අභ්‍යවකාශ තාක්ෂණ සහ යෙදවුම්)

**ඉංජිනේරු ජේ.කේ. ජයවර්ධන**
BSc. Eng., PG Dip., CEng., MIE(SL)
අධ්‍යක්ෂ (සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව)

**ඉංජිනේරු ජේ.ඩී.පී.එස්. අතුරලිය මිය**
BSc. Eng., MSc, CEng. MIE(SL),
MIET(UK)
අධ්‍යක්ෂ (ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව)

**ආර්.පී. දසනායක මයා**
BSc, PG Dip., MSc,
ජ්‍යෂ්ඨ පද්ධති විශ්ලේෂක සහ වැඩබලන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)

**ඉංජිනේරු එස්.ඒ. වැලිකල**
BEng., PG Dip., MBA
ජ්‍යෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ පැවරුම්)

**ජේ.එස්.බී. රත්නායක මයා**
BSc, CASL (Finalist), SAT (SL)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) සහ වැඩබලන ජ්‍යෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

## 1.7. සංවිධානාත්මක ව්‍යුහය



## 2.0 සභාපතිතුමාගේ පණිවුඩය

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ (ACCIMT) පාලක මණ්ඩල සභාපතිවරයා වශයෙන් එම ආයතනයේ 2022 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවුඩය නිකුත් කරන්නේ ඉමහත් සතුටිනි.

2022 වසර රටට මෙන්ම නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) සඳහා විශාල වශයෙන් අභියෝගාත්මක වසරක් විය. කෙසේවුවද, එකී හිතකර නොවන වාතාවරණයන් මෙන්ම සන්සන්දනාත්මකව අඩු පාරිශ්‍රමික හේතුවෙන් ආයතනික කාර්යමණ්ඩලයේ ප්‍රධාන කාණ්ඩ සඳහා පුද්ගලයින් ආකර්ෂණය කිරීමේ සහ රඳවා ගැනීමේ අඛණ්ඩ සීමාකිරීම් මධ්‍යයේ වුවද, සිය පර්යේෂණ සහ සංවර්ධන සහ අනෙකුත් තාක්ෂණ ක්‍රියාකාරකම්හි කැපී පෙනෙන සාර්ථකත්වයක් ලබාගැනීමට ආයතනයට හැකි විය.

ජාත්‍යන්තර සංවිධාන සමග සාර්ථක ලෙස සහයෝගීතාවන් ගොඩනඟා ගන්නා අතරම එමගින් නැනෝ චන්ද්‍රිකා ඇතුළුව අභ්‍යවකාශ තාක්ෂණ සහ යෙදවුම් ක්ෂේත්‍රයේ සැළකිය යුතු ප්‍රගතියක් ළඟාකර ගැනීමට අප ආයතනයට හැකි වී ඇත. එසේම, ACCIMT විසින් කර්මාන්ත අංශයේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමග සාර්ථක ලෙස හවුල්කාරීත්වයන් රාශියක් ගොඩනඟා ගෙන ඇත. මෙකී සහයෝගීතාවන් හරහා වැවිලි කර්මාන්ත අංශය, කාර්මික නිෂ්පාදන අංශය සහ ප්‍රවාහන අංශය (විශේෂයෙන් දුම්රිය) වැනි අංශ සඳහා ආයතනය විසින් වැඩිදියුණු කරන ලද තාක්ෂණ විසඳුම් විශේෂයෙන් කැපී පෙනේ.

එසේම, ආයතනය අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහ අනෙකුත් ආකාරයේ පුහුණු වැඩසටහන් තුලින් ක්ෂේත්‍රයේ සැළකිය යුතු ප්‍රගතියක් වාර්තා කර ඇත. ආයතනයේ මූලික සේවා ක්‍රියාකාරකම් වලට අනුව තාරකා විද්‍යා ක්ෂේත්‍රයේ නියලි රටේ එකම ආයතනය වශයෙන් හොඳ ප්‍රගතියක් අත්කර ගෙන තිබේ.

මහාචාර්ය කේ.පී.එස්.සී. ජයරත්න
පාලක මණ්ඩල සභාපති

# 3.0 අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව

සමාලෝචනයට ලක්වූ වසර තුළ නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT), කොවිඩ්-19 වසංගතයෙන් ද ඉන් අනතුරුව මුහුණ දුන් අහිතකර බලපෑම ද මැඩලමින්, ආයතනයේ තාක්ෂණික විශේෂඥතාවය ඇති මූලික ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු ප්‍රමාණයක ධාරිතා සංවර්ධනයක් ලඟාකර ගන්නා අතරම පර්යේෂණ සහ සංවර්ධන, තාක්ෂණික සේවාවන් සහ පුහුණු හා උපදේශන ඇතුළුව ආයතනයේ මූලික ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

2022 මාර්තු 24 වන දින ඒකක 6කින් යුත් KITSUNE නැනෝ චන්ද්‍රිකාව කක්ෂගත කිරීමත් සමග ආයතනය, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික වශයෙන් සම්පාදනය කර ඇති ප්‍රතිපත්ති සහ උපායමාර්ගික ලේඛනයන්හි ජාතික ධාරිතා සංවර්ධනය සඳහා වැදගත් වන ප්‍රධාන උසස් තාක්ෂණ ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන ඇති, අභ්‍යවකාශ තාක්ෂණයෙහි ජාතික ධාරිතාව සංවර්ධනය  ආයතනය විෂයෙහි  තවත් වැදගත් මංසළකුණක් වාර්තා කරනු ලැබීය. ජපානයේ කියුෂු තාක්ෂණ ආයතනය, ACCIMT, සිංගප්පූරුවේ නැන්යැන්ග් තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ කාර්මික හවුල්කරුවන් වන ජපානයේ Addnics Corporation සහ Harada Seiki Corporation අතර පස් පාර්ශවීය ජාත්‍යන්තර සහයෝගිතා ව්‍යාපෘතිය හරහා ACCIMT විසින් නිර්මාණය කිරීම සඳහා සහභාගි වූ දෙවන චන්ද්‍රිකාව සැලසුම් කිරීම, වැඩි දියුණු කිරීම, පරීක්ෂා කිරීම, දියත් කිරීම සහ කක්ෂගත කිරීමේ මෙහෙයුම් සිදුකරන ලදී. පෘථිවි නිරීක්ෂණ කැමරාව, චන්ද්‍රිකා පදනම් IoT, අයන ගෝලීය මිනුම් සහ ග්‍රාහක සහ සම්ප්‍රේෂණ සන්නිවේදන උපකරණය සහ ප්‍රමිතිගත ඒකක 2ක සනක චන්ද්‍රිකාව යන මෙහෙවර පහක් මෙයට ඇතුළත්වේ.

පසුගිය වසරවල අභ්‍යවකාශ තාක්ෂණ ක්ෂේත්‍රයේ ධාරිතා සංවර්ධනයේ දී ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ විවිධ ජාත්‍යන්තර/අන්තර් රාජ්‍ය සංසඳයන්හි දී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආයතනය විසින් මූලිකත්වය ගෙන ක්‍රියාකිරීම  ඇතුළුව අභ්‍යවකාශ තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ක්‍රියාකාරීන් සමඟ ආයතනය විසින් ගොඩනඟා ගනු ලැබූ ශක්තිමත් සම්බන්ධතාවන් නිසා ශ්‍රී ලංකාවෙන් ප්‍රාග්ධන දායකත්වයක් නොමැතිව, සම්පූර්ණයෙන් සිය උපායමාර්ගික සහ තාක්ෂණික දායකත්වය පමණක් උපයෝගී කරමින් ACCIMT මෙම ව්‍යාපෘතිය සඳහා සහයෝගිතා හවුල්කරුවෙකු ලෙස සහභාගි වීම මෙහිදී සුවිශේෂී වේ.

තනි ඒකක සනක චන්ද්‍රිකාවක (1U cube satellite) ඉංජිනේරු මොඩලය නිර්මාණය කිරීම සහ පරීක්ෂා කිරීම නැනෝ චන්ද්‍රිකා වැඩිදියුණු කිරීමේ තවත් එක් ආරම්භක පියවරකි. මෙම ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් පද්ධති ඉංජිනේරු විද්‍යාව, දේශීයව නිෂ්පාදනය කරන ලද නැනෝ චන්ද්‍රිකා උප පද්ධති අභ්‍යවකාශයේ පරීක්ෂා කිරීම මෙන්ම ගෝලීය නැනෝ චන්ද්‍රිකා කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා විදුලි බල සැපයුම, චන්ද්‍රිකාවේ රැගෙන යන පරිගණකය, සන්නිවේදන ආදී උප පද්ධති සැපයීමේ හැකියාව ගවේෂණය කිරීම තුළින් ඒ පිළිබඳ කුසලතා අත්පත්කර ගැනීමට ආයතනයට මඟ සැලසේ.

එසේම ආයතනය විසින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ දී තාක්ෂණය ඵලදායී ලෙස භාවිතයට ගැනීම සඳහා සහයෝගීතා ව්‍යාපෘති කීපයක්ම අත්හදා බැලීමට භාරගෙන ඇත. මෙරට තේ කර්මාන්තය මුහුණ දී ඇති පුහුණු කම්කරු (tea-pluckers) හිඟය සඳහා පිළියමක් ලෙස, ACCIMT ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සමඟ සහයෝගීතාවය ඇතිව විභව්‍ය යාන්ත්‍රිකරණ විසඳුමක් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය. මෙම තේ දළු නෙලන යන්ත්‍රය මගින් අතින් තේ දළු නෙලනවාට වඩා හතර ගුණයක කාර්යක්ෂමතාවක් ඉලක්ක කෙරේ. ඉහළ සාර්ථකත්වයක් සහිත මූලාකෘති වැඩිදියුණු කිරීමත් සමඟ මෙම වසර තුළ ව්‍යාපෘතිය කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. මෙම මූලාකෘති 70% කට වැඩි වරණීයතා කාර්යක්ෂමතාවක් ලඟාකර ගෙන ඇත. සිදුකරගෙන යමින් පවතින සංවර්ධන ප්‍රයත්නයන් මගින් තාක්ෂණය තවදුරටත් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

ඉහත සඳහන් ප්‍රධාන ව්‍යාපාති වලට අමතරව, 2022 වසරේදී පහත දැක්වෙන ව්‍යාපෘති ආරම්භ කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී. ඒවා නම්, තේ පර්යේෂණ ආයතනය සඳහා තාක්ෂණ සහය ලබාදීම, තේ වගාවන්හි කාලගුණය සහ පාංශු පෝෂක අධීක්ෂණය කිරීම සඳහා කෘෂිකාර්මික කෝෂය, වාහන බැටරි නිෂ්පාදන සහ අපනයනය සමාගමක් සඳහා කර්මාන්ත ශාලා අනුකූලතා පරීක්ෂා කිරීම සඳහා Acceptance and Cranking / Retention ටෙස්ටර්, ස්කැන්ඩිනේවියානු රටවල් සඳහා අපරාධ වලට එරෙහිව පුද්ගල ආරක්ෂක/ අනතුරු හැඟවීමේ උපකරණය (Alarmwear) සඳහා පරිශීලක අතුරු මුහුණත සහ ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (පෞද්ගලික) සමාගම සඳහා සංවේදක පදනම් ජල කරාම ක්‍රියාකරණය කිරීම වේ.

සමාලෝචනය ලක් වූ වසර තුළ ආරම්භ කරන ලද හෝ පෙර වසරක සිට අඛණ්ඩව සිදුකරගෙන එන නිර්මාණ සහ වැඩිදියුණු කරන ලද ව්‍යාපෘති වන්නේ Xilinx තාක්ෂණය භාවිතයෙන් නිපදවන ලද තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රය තාක්ෂණිකව පැවරීම සහ අලෙවි කිරීම, කෘතිම විවර රේඩාර් (SAR) පද්ධතිය, LoRa පදනම් සන්නිවේදන ජාලය, නැවත භාවිතා කළ හැකි රේඩියෝසොන්ඩෙ උපකරණයක් වැඩිදියුණු කිරීම, දියර පොහොර ඉසින ඩ්‍රෝන යානයක් සහ VTOL UAV වැඩිදියුණු කිරීම සහ දුරස්ථ පරාමිතීන් අධීක්ෂණය කිරීම සහ ස්විචවල ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කිරීමේ උපකරණය සඳහා දත්ත සටහන් කිරීමේ සහ හදිසි දැනුම් දීමේ පද්ධතියක් වැඩිදියුණු කිරීම වේ.

තවද, ආයතනය විසින් සේවාලාභීන්ගේ ඉල්ලීම් මත පදනම්ව දෝෂ හඳුනා ගැනීමේ සහ උසස් දාඩකාංග පිළිසකර කිරීමේ සේවාවන් සිදුකරන ලදී. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ S10 හා S12 බලවේග කට්ටල සඳහා රියදුරුට දර්ශනය වන පාලන පුවරු 35 ක් පිළිසකර කිරීම එක් කැපී පෙනෙන කාර්යයක්වේ. ඊට අමතරව M9 පන්තියේ දුම්රිය ඇන්ජින්වල faulty Traction control units සහ ප්‍රධාන සැකසුම් පද්ධතිය යථාතත්වයට පත් කිරීම සඳහා ටෙන්ඩර් දෙකක් ලබාගැනීමට ආයතනයට හැකි විය.

පහත සඳහන් වැදගත් දෘඩකාංග කිහිපයක් පිළිසකර කිරීමේ කාර්යයන්ද ආයතනයට පැවරී තිබේ. රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව සඳහා PLC ඒකකයක්, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා X කිරණ නල පිළිසකර කිරීම සහ INAEL LBS පාලකය පිළිසකර කිරීම, ස්වයංක්‍රීය ස්විච පාලකය සහ ලංකා විදුලි බල මණ්ඩලය සඳහා LBS RTU පැනල පිළිසකර කිරීම මෙයට අයත්ය. මෙම කාර්යයන් සාර්ථකව නිම කිරීම මගින් සේවාලාභියාගේ අවශ්‍යතාවන් ඉටුකිරීම පමණක් නොව සන්සන්දනාත්මකව ඉහළ පිරිවැයකට ජාත්‍යන්තර සැපයුම්කරුවන්ගෙන් මෙම සේවාවන් මිල දී ගැනීමේ අවශ්‍යතාවය අවමකර, කැපී පෙනෙන පිරිවැය ඉතිරි කිරීමක් ලබාදේ. මෙම කාර්යයන් මගින් ආයතනයේ විශේෂඥතාවය සහ විදේශ විනිමය සුරක්ෂිත කිරීම සඳහා එමගින් ලැබෙන දායකත්වය කැපී පෙනේ.

2022 වසරේ දී තොරතුරු තාක්ෂණ අංශය විසින් තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ගණනාවක් සිදුකරන ලදී. ඒවා නම්, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සමඟ සහයෝගීතාවයෙන් කෘෂිකාර්මික කෝෂ දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම, විශේෂිත අවශ්‍යතාවන් ගණනාවන් සඳහා ජංගම දුරකථන යෙදවුම් වැඩිදියුණු කිරීම, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා MIS මොඩියුලය, ආයතනය විසින් සිදුකරන ලද ව්‍යාපෘති සඳහා වෙබ් අතුරු මුහුණත් වැඩිදියුණු කිරීම සහ තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම සහ ආයතනික සහ බාහිර පාරිභෝගිකයින් සඳහා සිදුකරන ලද කාර්යයන් සඳහා නඩත්තු සහය සැලසීම වේ.

චීනයේ යුනාන් නිරීක්ෂණාගාරය සමඟ ද්විත්ව තාරකා පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතා පර්යේෂණය, තාරකා විද්‍යා වර්ණාවලීක්ෂ පර්යේෂණ සඳහා නව Echelle වර්ණාවලි දර්ශකයක් සකස් කිරීම සහ ශ්‍රී ලංකාව සඳහා සූර්ය පරාමිතීන් ගණනය කිරීමේ උපකරණය වැඩිදියුණු කිරීම ආයතනයේ තාරකා විද්‍යා අංශය විසින් සිදුකරන ලද ප්‍රධාන පර්යේෂණ, යටිතල පහසුකම් සහ අනෙකුත් ඒ හා සමාන සංවර්ධන ව්‍යාපෘති වලට අයත්වේ.

මෙයට අමතරව, අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම්, භූගෝලීය තොරතුරු පද්ධති සහ දුරස්ථ සංවේදනය යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සිදුකරනු ලැබීය. ඒවා නම්, විවෘත ප්‍රවේශ චන්ද්‍රිකා දත්ත මගින් ශ්‍රී ලංකාවේ වනාන්තර හායනය අධීක්ෂණය කිරීම සහ ප්‍රමාණනය කිරීම, අම්පාර දිස්ත්‍රික්කයේ විභව්‍ය ගැඹුරු වැසි ජල ජලධාරා ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා අභ්‍යවකාශ තාක්ෂණය පදනම් වූ ප්‍රවේශයක් සහ විදුලිබලය බෙදාහැරීමේ ජාලයේ දෝෂ සහිත යම් ස්ථානයක් හඳුනා ගැනීමේ මොඩලයක් (Geospatial modeling) නිර්මාණය කිරීම වේ.

වසංගතයට පසුව ඇතිවූ අයහපත් ආර්ථික තත්වය මධ්‍යයේ, දැඩි කාර්ය මණ්ඩල හිඟය ඇතුළුව බාධක ගණනාවකට මුහුණ දෙමින් වුවද, කාර්මික සේවා සඳහා ඇති ඉල්ලුමට අනුව නිත්‍ය සේවාවන් සැපයීමට ආයතනයට හැකි විය. ආයතනය විසින් ඉලෙක්ට්‍රොනික පරීක්ෂා කිරීමේ හා මැනුම් උපකරණ ක්‍රමාංකනය කිරීම, විවිධ ආකාරයේ ඉලෙක්ට්‍රොනික උපකරණ, උපාංග සහ මොඩියුලවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, ලෙඩ් අම්ල බැටරි සහ විසර්ජක ආරක්ෂක ආරක්ෂක උපකරණ මෙන්ම සන්නිවේදන සහ ගුවන් විදුලි විකාශන අංශය සඳහා සේවාවන් සපයනු ලැබීය.

2022 වසරේදී ආයතනය විසින් කාර්යසාධනය පරීක්ෂා කිරීමේ වාර්තා 105 හා ක්‍රමාංකන වාර්තා 148 ක් නිකුත් කරන ලදී. ඊට අමතරව ආයතනය විසින් සැලකිය යුතු ව්‍යාපෘති ගණනාවක් සඳහා උපදේශන සේවා සැපයීම සහ උසස් දෘඩකාංග පිළිසකර කිරීම් සිදුකරනු ලැබීය. එසේම, මූලිකවම රාජ්‍ය අංශයේ සේවාලාභීන් සඳහා අකුණු වලින් ආරක්ෂාවීමේ ක්ෂේත්‍රයේ ස්ථානීය පරීක්ෂා කිරීම්, පද්ධති සැලසුම් කිරීම්, ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම සහ ස්ථාපනය කිරීම් සහතික කිරීම ඇතුළුව තාක්ෂණික උපදේශන සේවාවන් ගණනාවක් ද සාර්ථකව ඉටුකරනු ලැබීය.

පැවති කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව ඇතිවූ ආර්ථික අර්බුදය මගින් අහිතකර බාහිර බලපෑම මැඩලමින්, ආකර්ෂණීය නොවන පාරිශ්‍රමික පරිපාටීන් සහ පරිපාලන නියාමන කරුණු වලට අදාල ගැටළු හේතුවෙන් ඇතිවූ උග්‍ර කාර්ය මණ්ඩල හිඟය නිසා  ඇති කරන ලද අනවරත අභියෝගයන්ට මුහුණ දෙමින් ACCIMT ආයතනය විසින් ඉහත සඳහන් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගෙන ඇති බව අවධාරණය කළ යුතුව ඇත.

ඉංජිනේරු (ආචාර්ය) සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
(නිල බලයෙන් පාලක මණ්ඩල සාමාජික)

# 4.0 ආයතනයේ අංශ

- ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය
- සන්නිවේදන අංශය/රොබෝ විද්‍යා අංශය
- කාර්මික සේවා අංශය
- අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම් / වකාශ තාක්ෂණ අංශයඅභ්‍ය/තාරකා විද්‍යා අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- පරිපාලන, මූල්‍ය හා මානව සම්පත් අංශය

## 5.0 ප්‍රධාන ව්‍යාපෘතිවල කාර්යසාධනයේ විශේෂ අවස්ථා

**වරණීය තේ දළු නෙලන යන්ත්‍රය**

චීනය, ඉන්දියාව සහ කෙන්යාවට පසුව ලෝකයේ හතරවන විශාලම තේ නිෂ්පාදකයා ලෙස ශ්‍රී ලංකාව සුවිශේෂීතාවයක් උසුලයි. කිලෝග්‍රෑම් බිලියන 2.2 කට වැඩියෙන් තේ නිෂ්පාදනය කරන චීනය මෙහිදී ප්‍රමුඛස්ථානය ගන්නා අතර ඉන්දියාව ආසන්න වශයෙන් කිලෝග්‍රෑම් බිලියන 1.2 ක් සහ කෙන්යාව තේ කිලෝග්‍රෑම් මිලියන 400 ක් ලෙස තේ නිෂ්පාදනය සඳහා දායකවේ. කිලෝග්‍රෑම් මිලියන 290 සිට 300 දක්වා පරාසයක වාර්ෂික අපනයන කරන ශ්‍රී ලංකාව, ගෝලීය තේ වෙළඳපල සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබාදේ.

කෙසේවුවද, විශේෂයෙන්ම තේ දළු නෙලීමේ ක්ෂේත්‍රයේ නිපුණ කම්කරු හිඟය සහ වැඩිවන කම්කරු ගාස්තු හමුවේ පසුබෑමට ලක්වන, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය මේ වනවිට බැරෑරුම් අභියෝගයන්ට මුහුණ දේ. මෙයට පිළියමක් වශයෙන් කම්කරු අවශ්‍යතාවය අඩුකරමින් සහ අවශ්‍ය පමණ වරණීයතාවය තහවුරු කරමින්, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් තේ දළු නෙලීම යාන්ත්‍රීකරණය කිරීමේ හැකියාව හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපදේශන මණ්ඩලය විසින් දේශීය මෙන්ම ජාත්‍යන්තර සහභාගිත්වය සහිත තරගකාරී අභිලාෂයන් කැඳවීමක් (EOI) හරහා තේ දළු නෙලීම යාන්ත්‍රිකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ACCIMT තෝරාගනු ලැබීය. මේරූ තේ කොළ සහ නටුව (අරිම්බු ලෙස හැඳින්වෙන) ඉතිරි වන්නට හැර තේ දළු (කොළ දෙකක් හෝ තුනක් සමඟ දල්ල හෝ ළපටි අංකුරය වැනි) නෙලීම සඳහා සුදුසු වරණීය තේ නෙලන යන්ත්‍රයක් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම තේ දළු නෙලීමේ යන්ත්‍රය මගින්, තේ ගසේ ද්වීතික වර්ධනය සුරක්ෂිත කරමින් පළමු තේ රිකිල්ල හානි කිරීමෙන් වැළකිය යුතුය. එසේම, එමගින් අතින් නෙලන ලද තේ දළු හා සංසන්දනාත්මකව තේ කොළ වල නැවුම් බව පවත්වා ගනිමින් අතින් තේ දළු නෙලනවාට වඩා හතර ගුණයක කාර්යක්ෂමතාවක් ඉලක්ක කෙරේ. යෝජිත සැලසුම් කළ යන්ත්‍රය මගින් යාන්ත්‍රික වරණීයතාව, තෙතමනය සහිත කාලගුණය සඳහා සුදුසුවීම, ක්ෂේත්‍රයේ විශ්වාසනීයත්වය සහ භාවිතයට පහසුබව වැනි වාසි ලබාදේ. එක් පුද්ගලයෙකු විසින් ක්‍රියාත්මක කිරීම සඳහා සැහැල්ලු ලෙස නිර්මාණය කරන ලද මෙම යන්ත්‍රය බැටරි මගින් දිගු කාලයක් ක්‍රියාත්මක කළ හැකි අතර අතින් තේ දළු නෙලීමේ කාර්යයට වඩා හතර ගුණයක කාර්යක්ෂමතාවකින් යුක්තවේ.

පළමු මූලිකෘතිය මුල් ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී සතුටුදායක ප්‍රතිඵල ලබාදෙමින්, මෙම වසර තුළ ව්‍යාපෘතිය කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත. ක්ෂේත්‍ර පරීක්ෂාවන් මගින් ලබාගත් දත්ත සහ නිරීක්ෂණ මත පදනම්ව සිදුකරන ලද වැඩිදියුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 70% ඉක්මවන වරණීයතා කාර්යක්ෂමතාවක් සහිත ඉහල සාර්ථකත්වයක් සහිත දෙවන මූලාකෘතියක් නිමකරන ලදී.





ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (TRISL) ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව සෑහීමට පත්ව ඇත. මේ සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම, මාස හයක පරීක්ෂණ කාලයක් සඳහා ඒකක හතරක් නිපදවීම දෙවන පියවරට ඇතුලත් වේ.

**නැනෝ චන්ද්‍රිකාව (6U) වැඩිදියුණු කිරීම හා KITSUNE 6U සමඟ ධාරිතා ගොඩනැගීම**

ජපානයේ කියුෂු තාක්ෂණ ආයතනයේ සහයෝගීතාව ඇතිව මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් 2022 වසරේදී ද කිට්සුනේ ලෙස නම් කරන ලද නව නැනෝ චන්ද්‍රිකාවක් නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම සහ දියත් කිරීම සඳහා වන ක්‍රියාකාරකම් සිදුකරනු ලැබීය. මෙම ව්‍යාපෘතිය මගින් ආයතනයේ ඉංජිනේරුවන්ගේ අභ්‍යවකාශ තාක්ෂණ ක්ෂේත්‍රයේ ධාරිතා සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කෙරේ.

ඒකක 6 කින් යුත් කිට්සුනේ නැනෝ චන්ද්‍රිකාව 2022 මාර්තු 24 දින සාර්ථක ලෙස දියත් කරනු ලැබීය. එය මීටර් 5 ක විභේදනයක් සහිත පෘථිවි නිරීක්ෂණය, චන්ද්‍රිකා පදනම් IoT, අයන ගෝලය සංවේදනය, අධිවේගී සන්නිවේදනය සහ ප්‍රමිතිකරණය කරන ලද සනක චන්ද්‍රිකාව ඇතුළුව මෙහෙවර පහකින් සමන්විත වේ. කියුටෙක් (Kyutech), නැන්යැන් තාක්ෂණ විශ්වවිද්‍යාලය (Nanyang Technological University), Harada Seiki Inc සහ Addnics Inc. (ජපානයේ කාර්මික හවුල්කරුවන් දෙදෙනා) සහ ACCIMT සමගින් එහි සියළු මෙහෙයන් සාර්ථකව ඉටුකරනු ලැබීය.







**ඒකක 1කින් සමන්විත සනක චන්ද්‍රිකාවේ ඉංජිනේරු මොඩලය නිර්මාණය කිරීම සහ පරීක්ෂා කිරීම**

ACCIMT ඉංජිනේරුවන් විසින් ඉලෙක්ට්‍රොනික සංරචක මට්ටමෙන් ආරම්භකර සාර්ථක ලෙස සනක චන්ද්‍රිකාව නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ නිපුණතා ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සිදුකරන කාලයේ දී, සනක චන්ද්‍රිකාවේ ඉංජිනේරු මොඩලය නිමකර ඇති අතර එය අනාගත චන්ද්‍රිකා දියත් කිරීමේ කාර්යයන්හි දී වැදගත් මෙවලමක් ලෙස ක්‍රියා කරයි. මෙම කාර්යය මගින් කැපීපෙනෙන ජයග්‍රහණ කීපයක් ළඟාකර ගෙන ඇත. ඒවානම්:

- ධාරිතා සංවර්ධනය ඇරඹුම; සනක චන්ද්‍රිකාවක් (CubeSat) දියත් කිරීම.
- ව්‍යාපෘති කළමනාකරණය සහ කණ්ඩායම් වැඩ සඳහා නිරාවරණය වීම පිළිබඳ කුසලතා වර්ධනය
- පද්ධති ඉංජිනේරු විද්‍යාව සඳහා නිරාවරණය වීම
- වර්ධනය වන නැනෝ චන්ද්‍රිකා කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා උප පද්ධති සැපයීමේ හැකියාව (උදා- සන්නිවේදන ප්‍රවරුව, චන්ද්‍රිකාවේ රැගෙන යන පරිගණකය, විදුලි බල පද්ධතිය, සන්නිවේදන පුවරුව)
- ශ්‍රී ලංකාවේ නිපදවන ලද නැනෝ චන්ද්‍රිකා උප පද්ධති අභ්‍යවකාශයේ පරීක්ෂා කිරීම

**නොමිලේ ලබා ගත හැකි චන්ද්‍රිකා දත්ත භාවිතයෙන් ශ්‍රී ලංකාවේ වනාන්තර පිරිහීම අධීක්ෂණය කිරීම සහ ප්‍රමාණනය කිරීම**




වන ආවරණය පරිසර පද්ධතීන්හි වැදගත් කාර්යභාරයක් ඉටුකරයි, නමුත් වනාන්තර එළිකිරීම සහ පිරිහීම ගෝලීය වශයෙන් සැලකිය යුතු තර්ජනයක් ඇතිකරයි. මේ අතර විශේෂයෙන්ම වනාන්තර බිම් ලෙස පෙනුන ද වන රක්ෂිත ක්‍රමයෙන් අඩුවන බැවින් වන පිරිහීම අධීක්ෂණය කිරීම අභියෝගාත්මක වේ. 2022 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දුරස්ථ සංවේදනය පදනම් කරගත් "වනාන්තර පිරිහීමේ දර්ශකයක්" වැඩිදියුණු කරන මෙන් ඉල්ලා සිටින ලදී. දැනට දෙපාර්තමේන්තුව සතුව රටේ වනාන්තර පිරිහීම තක්සේරු කිරීමට ක්‍රමයක් නැත. පිරිහීම වූ වනාන්තර නැවත යථා තත්වයට පත්කිරීමට සහ හානි වූ වනාන්තර බිම් පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමට සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වනාන්තර පිරිහීම වූ ප්‍රමාණය පිළිබඳ තොරතුරු තිබීම අත්‍යාවශ්‍යය. වනාන්තර පිරිහීම කිනම් කරුණු මත රඳාපවතී ද යන්න පිළිබඳව විවිධ පුද්ගලයින් විසින් වෙනස් දෘෂ්ඨි කෝණයකින් බලන බැවින් වනාන්තර වල තත්ත්වය හඳුනා ගැනීම සහ ඇගයීම සංකීර්ණ වේ.

එම ස්ථානයට ගොස් දත්ත එකතු කිරීමේ ක්‍රම හා සන්සන්දනය කිරීමේදී ඒ සඳහා ගතවන කාලය සහ ශ්‍රමය සැලකූ විට වනාන්තර පිරිහීම අධීක්ෂණය සඳහා චන්ද්‍රිකා ඡායාරූප පදනම් කරගත් ක්‍රම වඩාත් කාර්යක්ෂම වේ. 2022 දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය, 2023 වසරේදී නිම කිරීමට නියමිතය. මුළු රට පුරා වනාන්තර පිරිහීම සඳහා බලපාන විවිධ කරුණු ඡායාරූප ගැනීමේ මොඩල වැඩිදියුණු කර ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය ඇතිව අවසන් ඒකාබද්ධ වනාන්තර පිරිහීමේ දර්ශක සිතියම ක්‍රමාංකනය කිරීම සහ තහවුරු කිරීම සිදුකරනු ඇත.

# 6.0 පර්යේෂණ වැඩසටහන් සහ තාක්ෂණ සේවාවන්

## 6.1 කර්මාන්ත අංශය සඳහා ආරම්භ කර ඇති ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්

**තේ පර්යේෂණායතනය (TRISL) සඳහා තාක්ෂණ සහය : තේ වගාවන්හි දේශගුණය සහ පාංශු පෝෂක අධීක්ෂණය කිරීම සඳහා කෘෂිකාර්මික දත්ත පද්ධති**

තේ වගාව සඳහා නිවැරදි කෘෂිකාර්මික තාක්ෂණයන් යොදාගැනීමේ දී තේ පර්යේෂණායතනයේ කෘෂිකාර්මික දත්ත පද්ධති සඳහා සහය වීමට තේ වගා අංශයේ උන්නතිය උදෙසා උසස් තාක්ෂණයන් භාවිතය වැඩිදියුණු කිරීම ආරම්භ කරනු ලැබීය. පාරිසරික වෙනස්වීම් වල බලපෑම සහ පසේ තත්වය ඇතුළුව පාරිසරික දත්ත පදනම් කරගෙන ගොවි ප්‍රජාව වෙත තීරණ සහය පද්ධතියක් සැපයීම සඳහා වන මෙම ව්‍යාපෘතිය සඳහා ACCIMT විසින් නිෂ්පාදනය කරන ලද IOT (Internet of Things) භාවිතය ඇතුලත්ය.

භෝග සඳහා ජල අවශ්‍යතාවය සහ පොහොර භාවිතය ප්‍රශස්තකරණය කිරීම මෙම ව්‍යාපෘතියෙහි මූලික ප්‍රතිලාභ වේ. ශ්‍රී ලංකාව පොහොර ආනයනය කරන රටක් වන බැවින් පොහොර කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම ඉතා වැදගත්වේ. කාබනික වගාව කෙරේ යොමුවීමේ වත්මන් ප්‍රවණතාවයේදී නයිට්‍රජන්, පොස්පරස් සහ පොටැසියම් වැනි පාංශු පෝෂක නිශ්චිතව මැනීම අත්‍යාවශ්‍යය. තේ වගාවේ නිෂ්පාදන පිරිවැය සහ උත්පාදනය කරන ලද කාබන් පියසටහන්ද (carbon footprint) අඩුකරමින් ඵලදායිතාවය සහ තත්වය වැඩිදියුණු කිරීම සඳහා විශේෂඥ තීරණ මත පදනම්ව පොහොර භාවිතයට කළින් සහ පසුව මෙම ක්‍රියාමාර්ග ගනු ලැබේ. තවද, මෙම ප්‍රවේශය ගෝලීය ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රියාමාර්ග සඳහ ගැලපේ.

කෘෂිකර්මාන්තය ආශ්‍රිත වගා අධීක්ෂණ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා ACCIMT ආයතනය සතුව සාර්ථක අතීත අත්දැකීම් ඇත. ඒ හරහා එකතු කරගත් තොරතුරු දැන් තේ වගාකරණ ප්‍රජාවගේ ප්‍රතිලාභය පිණිස සකස් කෙරෙමින් සහ භාවිතා කරමින් පවතී. තත්‍ය කාල කාලගුණ මධ්‍යස්ථාන දත්ත සහ කෘෂි-කාලගුණය හා අදාල අනෙකුත් පාංශු පරාමිතීන් මෙසේ එකතු කරන ලද දත්ත වලට අයත් වේ.

මෙකී ආරම්භයන් මගින් විශේෂයෙන්ම තේ වගාවේ පොහොර යෙදීම සඳහා පාංශු පෝෂක හඳුනා ගැනීමේ ක්ෂේත්‍රයේ නව නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවන් ද හඳුනාගනු ලැබ තිබේ. දැනට කෙටි කාලයකදී නිවැරදි පර්යේෂණ ප්‍රතිඵල ලබාදිය හැකි උපකරණ වෙළඳපලෙහි ලබාගැනීමට නොහැකි වී තිබේ. වර්තමානයේ පවතින ක්‍රම සඳහා වැඩි ශ්‍රමයක් වැයවන අතර විශේෂඥ දැනුම සහිත රසායනික ද්‍රව්‍යය පරීක්ෂණාගාර අවශ්‍යයවේ.

  

මෙම ආරම්භ කරන ලද කාර්යය මගින් කාබනික පොහොර සහ අනෙකුත් පෝෂක සංයුතිය පරීක්ෂා කිරීම සඳහා ඉඩ සැළසෙන බැවින් එහි සමාජ-ආර්ථික බලපෑම වැදගත්වේ. ගොවීන්ට දැන් සිය භෝග සඳහා පෝෂක අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර සාම්පල පරීක්ෂා කිරීම් සිදුකිරීමට සහ ඒ අනුව නිර්දේශ ලබා ගැනීමට හැකිවේ.

සමස්තයක් ලෙස ගත්විට, මෙමගින් තේ වගාව සඳහා උසස් තාක්ෂණයන් සහ නිවැරදි කෘෂිකාර්මික ක්‍රම යෙදවීම මගින් ඵලදායිතාවය සහ තත්වය වැඩිදියුණුවීම පමණක් නොව පාරිසරික බලපෑම අඩුකරමින් සහ ශ්‍රී ලංකාවේ තේ වගාකරන ප්‍රජාවගේ සුභසිද්ධිය ප්‍රවර්ධනය කරමින් තිරසාර ක්‍රම භාවිතය සඳහා දායකවේ.

## IOT (Internet Of Things) මත පදනම්ව ජල මට්ටම අධීක්ෂණය කිරීමේ මධ්‍යස්ථාන

නිල්වලා ගඟේ ගුරුත්ව මධ්‍යස්ථානයන්හි පද්ධති කළමනාකරණය සඳහා ACCIMT විසින් වැඩිදියුණු කරන ලද ජල මට්ටම තත්‍ය කාලීනව, දුරස්ථව අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා දැනට පවතින නිෂ්පාදනය අනෙකුත් පිහිටීම් සඳහා සාර්ථකව පුළුල් කරන ලදී. මෙම වැඩිදියුණු කිරීම් වලට, ගංගා, ජලාශ සහ වැව් වැනි විවිධ ජලාශයන්හි ජල මට්ටම අධීක්ෂණය කිරීම සඳහා විශේෂයෙන් සැලසුම් කරන ලද ස්වාධීනව ක්‍රියාකරන සවිමත් නිපැයුම් අයත්ය.

එසේ සකස් කළ නිපැයුම් ජල මට්ටම අඛණ්ඩව අධීක්ෂණය කිරීම සඳහා ඉඩ සළසන අතර පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ ජංගම දුරකථන සහ පරිගණක මත ප්‍රදර්ශනය කළ හැකි තත්‍ය කාලීන දත්ත ලබාදේ. මෙමගින් පරිශීලකයාට ජල මට්ටම් පිළිබඳ වැදගත් තොරතුරු ලබාගැනීම සඳහා ක්ෂණිකව ප්‍රවේශවීමට හැකි වන අතර නිසි වේලාවට තීරණ ගැනීම සඳහා පහසුකම් සළසයි. ඊට අමතරව, එමගින් අවදානම් සහිත අවස්ථාවන්හි දී ඉක්මන් ක්‍රියාමාර්ග සහතික කරමින්, හදිසි අවස්ථාවන්හි දී පරිශීලකයින්ට ඒ බව දැනුම්දීමේ යාන්ත්‍රණයකින් සමන්විත වේ.

විවිධ පිහිටුම් වල දී ජල මට්ටම අධීක්ෂණය කිරීම සඳහා විශ්වාසනීය මෙවලමක් ලෙස ඒවායේ කල්පැවැත්ම සහ විවෘත පරිසරයන්ට යෝග්‍යබව තහවුරු කරමින් මෙම නිෂ්පාදනයන්, ශක්තිමත් ලෙස නිර්මාණය කර ඇත. ඒවා නව ප්‍රදේශයන් වෙත ව්‍යාප්ත කිරීම මගින් ජල කළමනාකරණය සහ සම්පත් අධීක්ෂණය සඳහා ඵලදායි විසඳුමක් ලබාදීමේ ACCIMTහි කැපවීම ප්‍රදර්ශනය කෙරේ.




සමස්තයක් ලෙස සැළකූවිට ACCIMT විසින් නිපදවන ලද ස්වාධීනව ක්‍රියාකළ හැකි මෙම දෘඩ නිෂ්පාදනය ජල සම්පත් වඩා හොඳින් කළමනාකරණය කිරීමට සහ විවිධ පිහිටීම්වල ඇති ජල පද්ධති ආශ්‍රිත ක්‍රියාවලීන් පිළිබඳව තීරණ ගැනීමට ආධාර වෙමින් තත්‍ය කාලීනව ජල මට්ටම අධීක්ෂණය කිරීම සඳහා ප්‍රායෝගික මෙන්ම කාර්යක්ෂම ක්‍රමවේදයක් සලසයි.

**නවීන පද්ධති වල දෝෂ හඳුනාගැනීම සහ උසස් දෘඩකාංග පිළිසකර කිරීම**

මෙම කාර්යය මගින් ක්ෂුද්‍ර සැකසුම් පද්ධති (microprocessor systems) සහිත ඉහළ වටිනාකමක් සහිත ආනයනික පද්ධතිවල දෝෂ පිළිසකර කිරීම සිදු කරන අතර රටේ විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඉතිරි කිරීම මෙන්ම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය එන්ජින් ක්‍රියා විරහිතව පවතින කාලය අඩු කෙරේ. පරීක්ෂා කරන ලද පද්ධති වල දෘඩකාංග සහ මෘදුකාංග මොඩියුල පිළිබඳ තාක්ෂණික ලේඛණ නොමැති අවස්ථාවන්හිදී, ACCIMTහි තාක්ෂණ විශේෂඥයින් විසින් විස්තීර්ණ ප්‍රතිවර්ත ඉංජිනේරු ක්‍රමවේද වලට අනුගත වෙමින් ඒවා යථා තත්වයට පත්කිරීමේ කාර්යයන් සිදුකර ඇත.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 2023 වසරේ ACCIMT හි ප්‍රධාන සේවාලාභියා වූ අතර S10 හා S12 පන්තිවල බලවේග දුම්රියන්හි රියදුරු පාලන පුවරු 35ක් යථා තත්වයට පත්කරනු ලැබීය. තවද, දුම්රිය එන්ජින් වල කර්ෂණ පාලන ඒකක (Traction control units ) සහ ප්‍රධාන සැකසුම් පද්ධති (Main Processor Systems) පිළිසකර කිරීම සඳහා තවත් ටෙන්ඩර දෙකක් ලබාගැනීමට ACCIMT සමත් විය.









**වාහන බැටරි නිෂ්පාදනය සහ අපනයනය කරන සමාගමක් සඳහා කර්මාන්තශාලා අනුකූලතා පරීක්ෂා කිරීම සඳහා උපකරණ (Acceptance and Cranking / Retention Testers) නිර්මාණය කිරීම**

දේශීය සහ අපනයන වෙළඳපල සඳහා බැටරි නිෂ්පාදන කරන අපනයන ඉලක්ක කරගත් ලීඩර් බැටරි මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සඳහා අනුකූලතාවන් පරීක්ෂා කිරීමේ උපකරණ දෙකක් (Acceptance සහ Cranking/Retention ටෙස්ටර) නිර්මාණය කර නිපදවීම සඳහා වන ව්‍යාපෘතියකි. මෙම

සමාගම ISO9001:2008 ප්‍රමිතීන්ට අනුගතව බැටරි නිෂ්පාදනය කිරීම සඳහා නවීන තාක්ෂණයන්ගෙන් සමන්විත සම්පූර්ණයෙන් ස්වයංක්‍රීය යන්ත්‍රාගාරයක් මගින් ක්‍රියාත්මක වේ. පිරිවිතර සකස් කිරීම නිමකර ඇති අතර පද්ධති වැඩිදියුණු කිරීම ආරම්භ කර ඇත. මෙවන් සහයෝගීතාවන්හි නිරතවීම මගින්, දිගු කාලීන වගකීමක් සහිතව සහ දැරිය හැකි මිලකට නියමිත වේලාවට නඩත්තු කිරීමේ සහය ලබාදෙයි. අවශ්‍යතාවයක් ඇතිවූ විට පද්ධති නවීකරණය සඳහා අප ආයතනය දේශීය නිෂ්පාදන සමාගම් සඳහා පහසුකම් සලසයි.






**ස්කැන්ඩිනේවියානු රටවල් සඳහා අපරාධයන්ට එරෙහිව පෞද්ගලික ආරක්ෂක/ අනතුරු ඇඟවීම් දීමේ පරිශීලක අතුරු මුහුණත නිර්මාණය කිරීම.**

ACCIMT විසින් මේවන විටත් අපරාධ වැළැක්වීම සඳහා නිෂ්පාදනයක් ලෙස, ස්කැන්ඩිනේවියානු රටවල් ඉලක්ක කරගනිමින් නිවෙසින් බැහැර පරිසරයේදී කාන්තාවන්ට පැළඳීම සඳහා "Alarmwear Unit" ඒකකයක් නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීම නිමකර ඇත. ටොස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් මෙම ව්‍යාපෘතියේ දේශීය හවුල්කරු වන අතර Alarmwear Sweden AB යන විදේශීය හවුල්කරු සඳහා එම ව්‍යාපෘතිය සිදුකරන ලදී. මෙම නිෂ්පාදනය LED තීරුවක් සහිත ඉන පටිය, අතේ රඳවා ගන්නා ඒකකය සහ ස්මාට් දුරකථනය යන මොඩියුල තුනකින් සමන්විත වේ.

අනතුරු හැඟවීමේ ඒකකය LED තීරුවේ පරාමිතීන්ට අනුව සැකසීම වෙනුවෙන් පරිශීලක අතුරු මුහුණතක් සකස් කිරීමේ කාර්යය ටොස් ලංකා වෙතින් ලබා දුන් අවශ්‍යතාවයකි.මෙම නව කාර්යය හා ආශ්‍රිත කාර්යයන් බොහොමයක් නිමකර ඇති අතර වැඩිදියුණු කිරීම් අවසන් කිරීම සහ එය පද්ධතිය සඳහා ඒකාබද්ධ කිරීම සඳහා සේවාලාභියාගේ ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.







**සංවේදනය මත පදනම් ජල කරාම ස්වයංක්‍රීයකරණය**

සාමාන්‍ය ජල කරාමයක් සංවේදනය මගින් ක්‍රියාත්මක ඒකකයක් බවට පරිවර්තනය කිරීමේ නවෝත්පාදන තාක්ෂණ විසඳුමක් සැලසුම්කර වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම වෙතින් ලද ඉල්ලීමක් මත මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මේ වනවිට සාම්පල ඒකක 05 ක් නිපදවා පරීක්ෂා කිරීම සඳහා සේවාලාභියා වෙත භාරදී ඇත. මෙම දේශීය වැඩිදියුණු කිරීම මගින් සේවාලාභියාට පද්ධති නවීකරණය සඳහා වැයවන වියදම ඉතිරි කරගැනීමට මෙන්ම නඩත්තුව සඳහා පිළිගත් දේශීය ආයතනයක් මගින් බාධාවකින් තොරව සහය ලබාගැනීමේ ප්‍රවේශයක් සඳහා ඉඩ සැළසේ.





## 6.2 ඉංජිනේරු/ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ආයතනික පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති

**Xilinx තාක්ෂණය පදනම් තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතියේ, තාක්ෂණ පැවරීම සහ අලෙවිකිරීම**

මෙම යන්ත්‍රය තේ කර්මාන්ත ශාලා වලින් ලබාගත් තේ සාම්පල සඳහා පර්යේෂණාගාරයන්හි දී සාර්ථක ලෙස පරීක්ෂා කරන ලද අතර ව්‍යාපෘති කණ්ඩායම විසින් අභ්‍යන්තර තාක්ෂණ පැවරීම සාර්ථකව සිදුකරනු ලැබීය. තවද, ව්‍යාපෘති ලේඛණ මේ වනවිට සම්පූර්ණ කර ඇත. මෙම පද්ධතිය වාණිජමය වශයෙන් පරීක්ෂා කිරීම සඳහා නිෂ්පාදන සහකරුවකු ආකර්ෂණය කරගන්නා අතරම ප්‍රජාව ඒ සඳහා හුරු පුරුදුවීම සඳහා ACCIMT පරිශ්‍රයේ එය ප්‍රදර්ශනය කර ඇත.

  

**කෘතිම විවර රේඩාර් (SAR) පද්ධතිය**

SAR යනු කාලගුණික තත්වයන් සහ හිරු එළියේ තීව්‍රතාවය මත රඳා නොපවතිමින්, භූ දර්ශනයන්ට සමානව, වස්තූන්හි ඉහළ ප්‍රභේදනයක් සහිත ද්විමාන හෝ ත්‍රිමාන ඡායාරූප ලබාගැනීම සඳහා භාවිතා කරන ප්‍රබල ක්ෂුද්‍ර තරංග දුරස්ථ සංවේදී තාක්ෂණයකි. තාක්ෂණ ප්‍රදර්ශනයකට පසු, ප්‍රායෝගික දැනුම ලබාදීමේ කාර්යයක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

**LoRa පදනම් සන්නිවේදන ජාලය**

ලංකා විදුලිබල මණ්ඩලය සඳහා ඉහල වෝල්ටීය සම්ප්‍රේෂණ මාර්ග දුරස්ථව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා, ලංකා විදුලිබල මණ්ඩලය (CEB), පේරාදෙණිය විශ්වවිද්‍යාලය (UOP) සහ ACCIMT අතර ත්‍රෛයිපාර්ශවීය ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වේ.

ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිබලය බෙදාහැරීමේ පද්ධතිය වඩා කාර්යක්ෂම ලෙස අධීක්ෂණය කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා රැහැන් රහිත දත්ත සන්නිවේදන ජාලයක් ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. බෙදාහැරීමේ පද්ධතිය වෙතින් ලබාගන්නා දත්ත පාලන මධ්‍යස්ථානය වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා LoRa (Low Power Long Range) පදනම් සන්නිවේදන ජාලයක් භාවිතා කරනු ඇත. දත්ත සකස් කිරීමෙන් සහ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, සේවා මධ්‍යස්ථාන හඳුනා ගැනීම පිණිස අදාල තොරතුරු අවශ්‍ය කටයුතු සඳහා යොමු කිරීමට හැකිවේ.

  

යෝජිත ව්‍යාපෘතියේ නිමැයුම් පහත දැක්වේ.

- විදුලි බලය බෙදාහැරීමේ පද්ධතිය අඩු වියදම් සහ තත්‍ය කාලීනව අධීක්ෂණය කිරීම (මෙහෙයුම් වියදමක් නොමැත)
- දෝෂ සහිත පිහිටීම් අනාවරණය කරගෙන ඒවා අදාල සේවා මධ්‍යස්ථාන වෙත යොමු කිරීම
- විදුලි බලය බෙදාහැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම, කළමනාකරණය සහ නඩත්තු කිරීම සඳහා දත්ත භාවිතා කිරීම
- විදුලි බලය බෙදාහැරීමේ පද්ධතිය ප්‍රශස්තකරණය
- අනාගත සැලසුම් සඳහා දත්ත භාවිතය
- දුරස්ථව නඩත්තු කිරීමේ හැකියාව විශ්ලේෂණය කිරීම

මේ වනවිට ව්‍යාපෘතියේ සංකල්ප අදියර පරීක්ෂාකර බැලීම නිමකර ඇත.

**නැවත භාවිතකළ හැකි රේඩියෝ සොන්ඩේ (Reusable Radiosonde) උපකරණයක් වැඩිදියුණු කිරීම**



රේඩියෝසොන්ඩෙ යනු සාමාන්‍යයෙන් කාලගුණ බැලුන මගින් වායුගෝලයට රැගෙනයාම සඳහා නිර්මාණය කරන ලද බැටරියෙන් ක්‍රියාකරන දත්ත පටිගත කරන උපකරණ වේ. මේවා උන්නතාංශ, පීඩනය, උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාව, සුළගේ වේගය සහ දිශාව මෙන්ම ඉහළ උන්නතාංශවල දී කොස්මික් කිරණ මිනුම් ඇතුළු විවිධ පරාමිතීන් මැනීම සඳහා භාවිතා කෙරේ.

වර්තමානයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, කාලගුණ අනාවැකි පළකිරීම සඳහා දේශීයව නිෂ්පාදනය කරන රේඩියෝසොන්ඩේ වල විභව්‍ය මිල හා සන්සන්දනය කළ විට ඉහළ මිලක් සහිත ආනයනය කරන ලද රේඩියෝසොන්ඩෙ මත රඳා පවතියි.

මෙම තත්වය රේඩියෝසොන්ඩේ දේශීයව නිපදවීම සාධාරණීකරණය කරයි. රේඩියෝසොන්ඩෙ දේශීයව නිෂ්පාදනය කිරීමේ හැකියාවන් ස්ථාපනය කිරීම මගින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාල පාර්ශවකරුවන්ට පිරිවැය ඉතිරි කිරීම මෙන්ම විශේෂ අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස ඒවා නිපදවීමේ හැකියාව මගින් ප්‍රතිලාභ ලැබීමේ හැකියාවක් පවතී.

තවද, රේඩියෝසොන්ඩේ දේශීයව නිෂ්පාදන කිරීමෙන් රට තුළ තාක්ෂණය පැවරීම, දැනුම වැඩිදියුණු වීම සහ ධාරිතා වර්ධනය සඳහා දායකවේ. එමගින් දේශීය සම්පත්, විශේෂඥ දැනුම සහ වායුගෝලීය මිනුම් කෂේත්‍රයේ නවෝත්පාදන භාවිතා කිරීමට හැකිවේ.

ආනයනය කරන ලද රේඩියෝසොන්ඩේ මත රඳාපැවැත්ම අඩුකිරීම සහ දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම මගින් දිගු කාලීන පිරිවැය ඉතිරි කිරීම්, වැඩිදියුණු වූ ස්වයංපාලනය සහ කාලගුණ අනාවැකි සහ වායුගෝලීය පර්යේෂණයන්හි වැඩිදියුණු වූ හැකියාවන් සඳහා විභව්‍යතාවක් පවතී.

**දියර පොහොර ඉසීම සඳහා ඩ්‍රෝන යානා**

කෘෂිකර්මාන්තයේදී දියර පෙහොර ඉසීමේ භාවිතයන්හි මෑත කාලීන ප්‍රගමනයන්, ACCIMT දියර පෙහොර ඉසීන ඩ්‍රෝන යානා පිළිබඳ නවෝත්පාදනයන්හි නියැලීමට පෙළඹ විය. විශේෂයෙන්ම තේ වගාව ඇතුළුව වැවිලි කර්මාන්තය සමග පැවැත්වූ සාකච්ඡා මගින් මේ සඳහා මග පෙන්වන ලදී. දියර පොහොර සහ කෘමිනාශක ඉසීම සඳහා දේශීයව නිෂ්පාදනය කරන ලද භ්‍රමණ තල කිපයක් සහිත ඉහළින් ගමන් කරන යානාවක් වැඩිදියුණු කිරීම සහ යොදාගැනීමේ ආර්ථික සහ තාක්ෂණික ශක්‍යතාවන් විශ්ලේෂණය කිරීමට එමගින් මහ සළසනු ලැබීය. සංකල්ප අධ්‍යයනය සාර්ථක ලෙස පරීක්ෂා කිරීමෙන් පසුව, ආවරණය ප්‍රශස්තකරණය කිරීම සඳහා කරනු ලැබූ ගණනය කිරීම් මත පදනම්ව මූලාකෘති පද්ධතිය සඳහා ආකෘති වැඩිදියුණු කරන ලද අතර බර, පැවැත්ම, වේගය, ධාරිතාව සහ මූල්‍යමය අවහිරතා වැනි පරාමිතීන් පිළිබඳව සළකා බලමින් ඉදිරියට ධාවනය කිරීමේ පද්ධතිය (propulsion system) වැඩිදියුණු කරන ලදී.

**සිරස්ව ගුවන්ගත කරන හා ගොඩබාන ඩ්‍රෝන (VTOL-UAV) වැඩිදියුණු කිරීම**

සිරස්ව ගුවන්ගත කරන සහ ගොඩබාන ආකාරයේ ඩ්‍රෝන යානයක් ACCIMT හි නිර්මාණයකර නිපදවනු ලැබීය. වැඩි ආවරණයක් අවශ්‍යය කරන අන්වේක්ෂණ යෙදවුම් සඳහා සාර්ථකව ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීමෙන් අනතුරුව මෙම ඩ්‍රෝන යානය වාණිජකරණය කිරීම සඳහා නිරාවරණය කරනු ඇත. මෙරට ආරක්ෂක අංශ සමග මෙය යොදාගැනීම සම්බන්ධයෙන් සහයෝගීතා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා අවස්ථාවන් සොයා බැලීමට ඇත.





**ස්විචවල ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කිරීමේ උපකරණය සඳහා දුරස්ථ පරාමිතීන් අධීක්ෂණය කිරීම, සටහන් කිරීම සහ අනතුරු ඇඟවීමේ පද්ධතිය**

විවිධ ආකාරයේ ස්විච පරීක්ෂා කිරීම් සිදුකිරීමේ දී ආයතනයේ ඉලෙක්ට්‍රොනික අංශය විසින් ඇසින් බලා නිරීක්ෂණය කළහැකි ලෝඩ් ඒකකයක් හා ඒකාබද්ධ වූ ස්විච පරීක්ෂා කිරීමේ උපකරණ භාවිතා කරයි. දැනට පවතින පද්ධතියේ ස්විචයට ගමන් කරන විද්‍යුත් ධාරාව පෙන්නුම් කරන අතර නියත ධාරාවක් බවට අතින් (manually) සත්‍යාපනය කරනු ලැබේ. නව ක්‍රමය මගින් පූර්ව නිගමනය කරන ලද කාල පරාසයන්හි දී ධාරාව සහ වෝල්ටීයතාවය සටහන් කිරීමේ නව ක්‍රමයක් යොදා ගන්නා බැවින්, පරිශීලකයාට අවශ්‍යය පරිදි දත්ත විශ්ලේෂණය කිරීමට හැකිවේ. මේ වන විට මෙම උපකරණය ක්‍රියාකාරිව පවතී.

 

**අකුණු වලින් ආරක්ෂාවීම සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම**

විදුලිසැර වැදීම් වලින් සිදුවන හානි හා පාඩු අඩුකිරීම, ආරක්ෂක ක්‍රමවේද ප්‍රමිතිකරණය සහ විෂයට අදාල පර්යේෂණ හා සංවර්ධන වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන ACCIMT විසින් අකුණු වලින් ආරක්ෂාවීමේ මධ්‍යස්ථානයක් යෝජනා කරනු ලැබීය. මූලිකව දැනුම බෙදාහැරීම සහ උපදේශන සේවා සැපයීම කෙරෙහි අවධානය යොමුකරමින්, පවතින සීමිත සම්පත් සමඟින් මෙම මධ්‍යස්ථානය 2019 සිට ක්‍රියාත්මකව පවතී. සලකා බලන ලද වසර තුළ, රටේ විවිධ ප්‍රදේශයන්හි පිහිටා ඇති රාජ්‍ය ආයතන සඳහා අකුණු ආරක්ෂක පද්ධති ව්‍යුහාත්මකව සැලසුම් කිරීම හා පරීක්ෂා කිරීමේ සේවාවන් පිළිබඳ උපදේශන කීපයක් ලබාදෙනු ලැබීය.





**තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති**

**රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල ඉල්ලීම් මත, ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් පරිශීලක විශේෂිත තොරතුරු පද්ධති විසඳුම් වැඩිදියුණු කර ඇත.**

**තොරතුරු තාක්ෂණ (IT) විසඳුම් වැඩිදියුණු කිරීම**

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සහයෝගීතාවය ඇතිව ඇග්‍රිසෙල් (Agri-Cell) දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම.**
තේ පර්යේෂණ ආයතනය විසින් නිකුත් කරන ලද උපදේශන වාර්තා සහ නෙමටෝඩ වාර්තා සඳහා ACCIMT විසින් වැඩිදියුණු කරන ලද සහ ස්ථාපනය කරන ලද IoT පද්ධති මගින් එකතු කරන ලද කාලගුණ දත්ත සහ පාංශු දත්ත ගබඩා කිරීම සඳහා පහසුකම් සැලසීමට වෙබ් අඩවියක් වැඩිදියුණු කරමින් පවතී. ඉදිරියේදී මෙම දත්ත පර්යේෂණ, සැලසුම් සහ අනෙකුත් මෙහෙයුම් අවශ්‍යතාවන් සඳහා වැවිලි සමාගම් වලට ඉතා සුළු මිලකට ලබාගත හැකි වනු ඇත. දත්ත සහ අදාල වාර්තා මධ්‍යගත දත්ත ගබඩාවක ගබඩා කිරීම සඳහා වෙබ් පාදක අතුරු මුහුණතක් වැඩිදියුණු කරනු ඇති අතර එහි ප්‍රවේශය අවසරලත් පුද්ගලයින්ට සීමාවනු ඇත.







**ජංගම දුරකථන යෙදවුම් වැඩිදියුණු කිරීම**
මහා පරිමාණ තේ වතු සහ කුඩා පරිමාණ තේ ඉඩම්වල ප්‍රමාණය පිළිබඳ තොරතුරු නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ තේ වගාකරන ලද ප්‍රදේශය පුරෝකථනය කිරීම අසීරුවේ. සාම්ප්‍රදායික ක්‍රමවේද සමඟින් සමීක්ෂණ සිදුකිරීම සඳහා කාලය ගතවන අතර වියදම අධිකය. එබැවින් දුරකථන ජාල හා සම්බන්ධ නොවූ සිතියම් සමග GPS දත්ත මගින් තේ වගාකර ඇති ප්‍රදේශ සමීක්ෂණය කිරීම සඳහා ඇන්ඩ්‍රොයිඩ් දුරකථන යෙදවුමක් හඳුන්වාදීම වඩාත් හොඳ විසඳුමක් වනු ඇත. මෙම යෙදවුම මගින් අන්තර්ජාල සම්බන්ධතාවය සීමාසහිත දුරස්ථ ප්‍රදේශයන්හි පවා එම පිහිටුමට අදාළව විශේෂ තොරතුරු ඇතුළුව තේ වතු පිළිබඳ නිවැරදි දත්ත එකතු කිරීම සඳහා උපකාරීවේ. මෙම යෙදවුම, අන්තර්ජාල සම්බන්ධතාවය නොමැතිව තොරතුරු එකතු කිරීමේ හැකියාව සහ සම්බන්ධතාවයයථාතත්වයට පත්වූ විට ප්‍රධාන සර්වරයට දත්ත උඩුගත කිරීමේ හැකියාව සහිතය. යෙදවුමෙහි පරිශීලක පහසු අතුරු මුහුණත මගින් පිහිටුම පිළිබඳ දත්ත අතින් හෝ ස්වයංක්‍රීයව ආරක්ෂා කිරීමට (saving) හැකි බැවින් වගා කිරීම, අස්වැන්න නෙලීම සහ පොහොර යෙදීම වැනි අමතර ක්ෂේත්‍ර (fields) ඇතුළත් කිරීම මගින් පරිශීලකයින්ට අනන්‍ය සමීක්ෂණ සිදුකිරීමට ඉඩ

සැලසේ. මෙම යෙදවුම තේ සහ අනෙකුත් කෘෂිකාර්මික භෝග මෙන්ම ඉඩම් භාවිතය පිළිබඳ නිවැරදි සමීක්ෂණ දත්ත රැස්කිරීම සඳහා කාර්යක්ෂම සහ විශ්වාසනීය මෙවලමක් වනු ඇත.

**බෞද්ධ සහ පාලි විශ්වවිද්‍යාලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS Module)**

වාහන කළමනාකරණය, ගබඩා, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යයන්ට අදාල උප මොඩියුල නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කරනු ලැබීය. එසේම පහත සඳහන් මූලික යෙදවුම් තවදුරටත් වැඩිදියුණු කරන ලදී.

- බාහිර විභාග ශාඛාව සඳහා MA සහ BA සිසුන් විභාග සඳහා ලියාපදිංචි කිරීමේ මොඩියුලය නිමකරන ලදී.
- අභ්‍යන්තර සිසුන් ලියාපදිංචි කිරීම සඳහා මාර්ගගත අයදුම්කරුවන්ගේ විස්තර සහ සිසුන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය නිමකරන ලදී.









**ගිවිසුම්ගත සේවාවන්**

දත්ත ගබඩා හා වෙනත් තොරතුරු පද්ධති ගිවිසුම්ගතව නඩත්තු කිරීම්

- ගිණුම් පද්ධතිය - මොරටුව විශ්වවිද්‍යාලය. නඩත්තු ගිවිසුම් අත්සන් කර ඇත.
- ගිණුම් පද්ධතිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. නඩත්තු ගිවිසුම් අත්සන් කර ඇත.
- වැටුප් පද්ධතිය - සංවර්ධන ලොතරැයි මණ්ඩලය. නඩත්තු ගිවිසුම් අත්සන් කර ඇත.
- ගිණුම් පද්ධතිය - බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. නඩත්තු ගිවිසුම් අත්සන් කර ඇත.

**ආයතනික මෘදුකාංග වැඩිදියුණු කිරීම්**

අභ්‍යන්තර පරිපාලන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා, 2022 වසරේදී පහත සඳහන් මෘදුකාංග පද්ධති තවදුරටත් වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම සිදුකරන ලදී.

- ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ පද්ධතිය
- ව්‍යාපෘති ලියාපදිංචි කිරීමේ පද්ධතිය
- නිවාඩු සහ පැමිණීම සටහන් කිරීමේ පද්ධතිය
- ගිණුම් පද්ධතිය
- ඉන්වොයිස් පද්ධතිය

**ACCIMT LAN, වෙබ් අඩවිය හා අදාල ජාල සේවාවන්**

ආයතනය සඳහා LAN, අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් සේවාවන් නඩත්තු කරන ලදී.

## 6.3 තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති

**ද්විත්ව තාරකා පිළිබඳ ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණය**

සුදු වාමනයන්, accretion disk, Roche-Lobe, hotspot ආදී ද්විත්ව තාරකා පද්ධති වල එක් එක් සංරචක හා සම්බන්ධ ස්කන්ධය මාරුවීම්, පිපිරුම්, කෝණික චලනය නැතිවීම, චුම්බක ලක්ෂණ, කක්ෂීය චලනය ආදිය සම්බන්ධ යාන්ත්‍රණයක් ඔස්සේ නෝවා, නෝවා-වැනි පද්ධති, නිලීන නෝවා, රිකරන්ට් නෝවා, සුපර්නෝවා, චුම්බක හා මධ්‍යම චුම්බක CVs හා ඒවායේ උප පද්ධති ආදී විවිධ ද්විත්ව තාරකාවල සම්භවය පිළිබඳ ලක්ෂණ අධ්‍යයනය කිරීම සහ අන්වේක්ෂණය කිරීම මෙම දිගුකාලීන පර්යේෂණයේ අරමුණයි.

මෙම ජාත්‍යන්තර සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘතිය, චීන විද්‍යා ඇකඩමිය යටතේ යුනාන් තාරකා විද්‍යා නිරීක්ෂණාගාරය සමඟ සහයෝගීතාවය ඇතිව 2018 වසරේදී ආරම්භ විය. මෙම කාල සීමාව තුළ ඇමරිකානු තාරකා විද්‍යා සංගමයේ සඟරා ඇතුළුව ජාත්‍යන්තර සඟරා හතරක් සහ දේශීය ප්‍රකාශන දෙකක් සම්පූර්ණ කරන ලදී. සබරගමුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද ව්‍යවහාරික විද්‍යා උපාධි අපේක්ෂක පර්යේෂණ සිම්පෝසියම් (APSURS) 2022 සඟරාවේ පර්යේෂණ පත්‍රිකාවක් පළකරන ලදී.

### ශ්‍රී ලංකාව සඳහා සූර්ය පරාමිතීන් ගණනය කිරීමේ යන්ත්‍රයක්

පයිතන් පරිගණක වැඩසටහන් භාෂාව සහ තාරකා විද්‍යාත්මක ඇල්ගොරිදම භාවිතයෙන් සූර්ය පරාමිතීන් ගණනය කිරිම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා වින්ඩෝ යෙදවුමක් වැඩිදියුණු කරන ලදී. ඕනෑම අවස්ථාවක සූර්යයාගේ පිහිටුම සහ වේලාව සොයා ගැනීමට හැකිවීම මෙම යෙදවුමෙහි ප්‍රධාන භාවිත වේ. මෙම යෙදවුම පදනම්ව පාසැල් විෂය ධාරාව සඳහා තාරකා විද්‍යාත්මක ක්‍රියාකාරකම් හඳුන්වා දිය හැකිය. මෙය සූර්ය පැනල මගින් කාර්යක්ෂම ලෙස විදුලි බලය උත්පාදනය සඳහා සූර්යයාගේ පිහිටීම සොයා බැලීමට සූර්ය ඛණ්ඩාංක ඇතුළත් කිරීම සඳහා භාවිතා කළ හැකිවේ.




### තාරකා විද්‍යාත්මක වර්ණාවලීක්ෂ පර්යේෂණ සඳහා නව Echelle වර්ණාවලි දර්ශකයක් සකස් කිරීම

Echelle වර්ණාවලි දර්ශක මගින් එකවර ඉහල වර්ණාවලි විභේදනයක් සහ විශාල වර්ණාවලි කලාපයක් ලබාදේ. මෙම උපකරණය ACCIMT හි තාරකා විද්‍යා අංශයේ සාර්ථකව ස්ථාපනය කර ඇති අතර එය භාවිතාකර සූර්යයාගේ ඉහළ විභේදනයක් සහිත වර්ණාවලිය ලබාගනු ලැබීය.





## 6.4. දුරස්ථ සංවේදනය (RS) සහ භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සම්බන්ධ පර්යේෂණ ව්‍යාපෘති

අම්පාර දිස්ත්‍රික්කයේ විභව්‍ය වැසි ජලය මගින් ජලය ලබාගන්නා ජලධාරා ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා අභ්‍යවකාශ තාක්ෂණය පදනම් ප්‍රවේශයක් හඳුන්වා දෙන ලදී.




රටේ සංවර්ධනය සඳහා ජල සම්පත ඉතා වැදගත්වේ. 2.3% වන සමස්ත ගෝලීය මිරිදිය ජලයෙන් මිනිස් පරිභෝජනය සඳහා භාවිතයට ගත හැක්කේ 1% පමණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අම්පාර දිස්ත්‍රික්කය වැනි වියළි ප්‍රදේශයන්හි ජල සම්පත ඵලදායි ලෙස කළමනාකරණය කිරීම අත්‍යාවශ්‍ය වේ. කෘෂිකර්මාන්තය ප්‍රදේශයේ ජනතාවගේ මූලික ආදායම් ප්‍රභවයක් වන නමුත් නිසි සැලසුමක් සහ කළමනාකරණයක් නොමැති නිසා ගොවිතැන් කටයුතු සඳහා ජල හිඟයක් ඇතිවී තිබේ. වැසි ජලය රැස්කිරීම වැනි විකල්ප විසඳුමක් හඳුන්වා දී අඛණ්ඩ සහ පරිසර හිතකාමී ජල සැපයුමක් ලබාදීම මගින් ඔවුන්ගේ ජීවනෝපාය සැළකිය යුතු ලෙස වැඩිදියුණු කළ හැකිය.

ජලවිද්‍යාව, දේශගුණය, පස, භූ ලක්ෂණ සහ පාරිසරික ආර්ථික තත්ත්ව වැනි සාධක සැළකීමේදී සුදුසු වැසිජලය රැස්කිරීමේ ස්ථාන තෝරාගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ වේ. කෙසේවුවද, GIS සහ දුරස්ථ සංවේදන තාක්ෂණයන් භාවිතයෙන් ප්‍රශස්ත ස්ථාන හඳුනා ගැනීම මගින් මෙම ක්‍රියාවලිය සරල කරයි. තීරණ ගැනීම සඳහා ක්ෂේත්‍ර පරිමාව උන්නතාංශ වක්‍රය (area volume elevation curve) සහ වෙනත් ක්‍රමවේද භාවිතා කරමින් අම්පාර දිස්ත්‍රික්කයේ වැසි ජලය රැස්කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ.

පිරිවැය සහ වේලාව සැලකූවිට, විශේෂයෙන් විශාල අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා යෝජිත ප්‍රවේශය කාර්යක්ෂම වේ. අම්පාර දිස්ත්‍රික්කය සඳහා භූගත ජලය කෘතිම ජලධාරා කලාප සිතියම උත්පාදනය නිර්මාණය කරනු ලැබීය.

### විදුලිය බෙදාහැරීමේ ජාලවල ස්ථානීය පිහිටීම ආදෘශ්‍යය (Geospatial modeling)





අපගේ එදිනෙදා ජීවිතය සහ සමාජීය සංවර්ධනය සඳහා විදුලි බලය අත්‍යාවශ්‍ය වේ. රටක සාර්ථකත්වය සහ ආර්ථික සුභසිද්ධිය සඳහා කාර්යක්ෂම විදුලිබල භාවිතයක් අත්‍යාවශ්‍ය වේ. කෙසේ වුවද, දුර්වල ආර්ථික සංවර්ධනය සහ විදුලි බලය බෙදාහැරීමේ ජාල සඳහා ප්‍රමාණවත් අවධානයන් ලබානොදීම නිසා ශ්‍රී ලංකාව වර්තමානයේ ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටී. සදාචාරාත්මක නොවන ක්‍රියා සහ අකාර්ෂක්ෂමතාවන්, විදුලිබලය උත්පාදන හිඟය, දුර්වල

යටිතල පහසුකම්, දුර්වල උපයෝජන කාර්යක්ෂමතාවය සහ ආයෝජන සහ නඩත්තු කිරීම් නොසළකා හැරීම් ප්‍රතිඵල කරමින් විදුලිබල අංශය ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් පහළට වැටී ඇත. ආයතනය ඵලදායි ලෙස පවත්වා ගැනීම සඳහා එහි වත්කම්, ඒවායේ තත්වය, කාර්යසාධනය සහ පිරිවැය පිළිබඳ පුළුල් අවබෝධයක් තිබීම අවශ්‍යය වේ. මෙම ව්‍යාපෘතියේදී මධ්‍යම වෝල්ටීයතා විදුලිබල බෙදාහැරීමේ මොඩලයක් නිර්මාණය කිරීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සහ දුරස්ථ සංවේදනය භාවිතා කරනු ඇත. විදුලිය බෙදාහැරීමේ පද්ධතිවල සංකීර්ණතාවන් පිළිබඳ විසඳුම් ලබාදීමට මෙම තාක්ෂණයන් හඳුන්වා දේ. දත්ත රැස්කිරීම සහ උපයෝගිතා පද්ධති වල වත්කම් කළමනාකරණය සඳහා ජංගම දුරකථන යෙදවුමක් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. ට්‍රාන්ස්ෆෝමර්, විදුලි කණු, පිළිබඳ තොරතුරු එකතුකිරීම සහ පාරිභෝගික දර්ශක සැකසීම මෙයට ඇතුළත්වේ. ප්‍රමිතිගත භූගෝලීය තොරතුරු භාවිතයෙන් තත්‍ය ලෝකය සංකල්පමය, භූගෝලීය, ඩිජිටල් සහ ව්‍යාපෘති ලෝක බවට පරිවර්තනය කිරීම මෙම ක්‍රියාවලියට අයත්වේ.

## 6.5. පර්යේෂණ ප්‍රකාශන

**සඟරාවන්හි පළකිරීම්**

*(i). Jayawardhana, W.G.N.N., Chathurange, V.M.I., Premakantha, K.T., Alawathugoda, R.M.D., Estimation and Mapping of Mangrove Aboveground Biomass in Sri Lanka using Sentinel I Satellite Imageries,2022, The Sri Lanka Forester, Vol.41, 47:62*

*(ii). P R S Tissera, N I Medagangoda, N S Bandara, GMLP Aponsu, Identifying intrinsic Parameters using orbital properties of cataclysmic variable stars, journal of Applied Sciences Undergraduate Research Symposium (APSURS)- 2022*

**පොත් පරිච්ඡේද වල පළකිරීම්**

*Kumar, S.,Jayawardhana W.G.N.N., Potential of Spaceborne Bistatic Polarimetric Interferometric SAR Modeling for Vegetation Height Estimation,2022, Handbook of Himalayan Ecosystems and Sustainability, Vol. 1: Spatio-Temporal Monitoring of Forests and Climate (CRC Press), DOI: https://doi.org/10.1201/9781003268383, eBook ISBN: 9781003268383.*

## 6.6. පරීක්ෂණ හා මිණුම්, දෘඩකාංග පිළිසකර කිරීම් සහ උපදේශන සේවා

**විදුලිබල ඉලෙක්ට්‍රොනික මිනුම් විද්‍යාගාරයේ පරීක්ෂා කිරීම් හා මැනුම් සේවාවන් - ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය**

මෙම වසර තුල මෙම අංශය විසින් මූලික වශයෙන් බැටරි, අකුණු ආරක්ෂක උපකරණ (SPDs), විදුලි පේනු, සොකට්, ස්විච, RC පරිපථ භේදක (RCCB), ක්ෂුද්‍රරූපී පරිපථ භේදක (MCB) හා අපවර්තක සඳහා කාර්යසාධන පරීක්ෂණ වාර්තා 105 ක් නිකුත් කරන ලදී. තවද, මෙම අංශය විසින් පාරිභෝගික පිහිටීම් වලදී සිදුකරන ලද විදුලිබල තත්ව මිනුම් වලට අමතරව විද්‍යුත්/ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන වල ආරක්ෂාව පරීක්ෂා කිරීම හා විදුලිබල තත්ව මිනුම් සිදුකරනු ලැබීය.

ඩග්ලස් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්ෂරස් (සිලෝන්) ලිමිටඩ්, ඒසීඑල් ඉලෙක්ට්‍රික් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පනි පීඑල්සී ප්‍රධාන සේවාලාභීන්ට අයත් වේ.










**ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය විසින් සිදුකළ ගැටළු සඳහා විසඳුම් ලබාදීමේ/ අළුත්වැඩියා කිරීමේ සේවාවන් හා උපදේශන කාර්යයන්** සමාලෝචනයට ලක්වන කාලය තුළ ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය විසින් උපදේශන හා දෘඩකාංග පිළිසකර කිරීමේ කාර්යයන් 62 ක් සිදුකරන ලදී.










සිදුකරන ලද ප්‍රධාන දෘඩකාංග පිළිසකර කිරීම හා උපදේශන සේවාවන්ට;

- SD&CC සඳහා PLC ඒකක පිළිසකර කිරීම.
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා X-කිරණ නලයක් පිළිසකර කිරීම.
- ලංකා විදුලිබල මණ්ඩලය සඳහා INAEL LBS පාලක උපකරණය, ස්වයංක්‍රීය ස්විච පාලන උපකරණය සහ LBS RTU පැනලය පිළිසකර කිරීම.

**සන්නිවේදන අංශය විසින් සිදුකරන ලද පරීක්ෂා කිරීම් හා මැනුම් සහ උපදේශන සේවා**

පරිශීලක භාවිතය විශ්ලේෂණය අනුව කර්මාන්ත සඳහා උපදේශන සැපයීම, කේබල්/ඇන්ටනා පරීක්ෂා කිරීම්, උපකරණවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, ගුවන් විදුලි යෙදවුම් පරීක්ෂා කිරීම හා මිනුම් සේවාවන් සැපයීම සහ සුළු පිළිසකර කිරීම් මේ යටතේ සිදුකරනු ලැබූ කාර්යයන් වේ.

පහත සඳහන් සමාගම් සඳහා උපදේශන සිදුකර ඇත.

- විශේෂ කාර්යය බලකාය
- බ්‍රැන්ඩික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය සහ කැළණි කේබල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත මිනුම් ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදුකරනු ලැබීය.

**ක්‍රමාංකන විද්‍යාගාරය - කාර්මික සේවා අංශය**



2022 වසර තුළ ප්‍රධාන වශයෙන්ම ඉලෙක්ට්‍රොනික හා ඉලෙක්ට්‍රිකල් පරීක්ෂා කිරීමේ උපකරණ සඳහා ක්‍රමාංකන සේවාවන් සපයනු ලැබූ අතර ක්‍රමාංකන වාර්තා 148 ක් නිකුත් කරනු ලැබීය. ඩිජිටල්/ ඇනලොග් මල්ටි මීටර්, දෝලනේක්ෂ, ස්කෝප් මීටර්, AC/DC ක්ලැම්ප් මීටර්, ඉහල වෝල්ටීයතා ටෙස්ටර, Hipot ටෙස්ටර, විදුලි බලය කාන්දුවීම පරීක්ෂා කිරීමේ උපකරණ, අත්වැසුම් පරීක්ෂා කිරීමේ මීටර්, විදුලිබල හා සංඛ්‍යාත විශ්ලේෂක, වොට් මීටර, වෝල්ට් මීටර්, එහා මෙහා ගෙනයා හැකි යන්ත්‍ර පරීක්ෂා කිරීමේ උපකරණ, පරිවරණ අඛණ්ඩතාව පරීක්ෂා කිරීමේ උපකරණ, භූගත කිරීම් පරීක්ෂා කිරීමේ උපකරණ, RCCB පරීක්ෂා කිරීමේ උපකරණ, සහ බහුකාර්ය පරීක්ෂා කිරීමේ උපකරණ ක්‍රමාංකනය කරන ලද උපකරණ වලට අයත්වේ.

LTL ට්‍රාන්ස්ෆෝමර්ස්, කොකොකු ලංකා, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, හයිටෙක් සෙන්සර් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඩිමෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, ප්‍රොෆෙෂනල් මෙට කන්සල්ටන්සි, වෙනෝරා ඉන්ටර්නැෂනල්, ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම, බැල්ෆෝ බීටී, පුබුදු ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, රිචඩ්සන් ප්‍රොජෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඉලෙක්ට්‍රො මෙටල් ප්‍රොසෙසින් (ප්‍රයිවට්) ලිමිටඩ්, අපගේ ප්‍රධාන සේවාලාභීන්වේ.

**ආලෝක මිනුම් සේවා (LMS) විද්‍යාගාරය මගින් පිරිනමන ලද ආලෝක මිනුම් සේවාවන් - කාර්මික සේවා අංශය**





LED හා CFL විදුලි පහන් පරීක්ෂා කිරීම සඳහා ආලෝක මිනුම් සේවාවන් සිදුකරනු ලැබූ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහයෝගීතාවය ඇතිව පරීක්ෂණ වාර්තා තිස් නවයක් නිකුත් කරන ලදී. මින්ග් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, රිසිල්කෝ මාකටින්, සුගත් ඉලෙක්ට්‍රිකල් සහ සිග්නිෆයි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් අපගේ ප්‍රධාන සේවාලාභීන් වේ.

# 7.0 පුහුණු, අධ්‍යාපන සහ තොරතුරු බෙදාහැරීම

## 7.1. වෘත්තිකයන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්

CPD පාඨමාලාව - ජෛවීවියේ පද්ධති විද්‍යාව සඳහා භූගෝලීය තොරතුරු

තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් අනුගමනය කරමින් ලෝක ආහාර වැඩසටහන (WFP) විසින් තණමල්විල, විල්ගමුව, කෝප්පායි, කිරාන් සහ මන්නාරම යන තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නිලධාරීන් 125 ක් සඳහා ජෛවීවියේ පද්ධති විද්‍යාව සහ භූගෝලීය තොරතුරු පිළිබඳ වැඩමුළු පහක් පැවැත්වීමට ACCIMT ට ලංසු පිරිනමනු ලැබීය.

සිය එදිනෙදා කාර්යයන් සිදුකිරීමේදී භූගෝලීය තොරතුරු සංකල්ප අදාල කරගැනීම පිළිබඳව සහභාගිවූවන් හුරුපුරුදු කිරීම විශේෂයෙන්ම භූගෝලීය තොරතුරු පද්ධති (GIS) ක්ෂේත්‍රය පිළිබඳව ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම මෙම වැඩමුළුවේ අරමුණයි.





**දුම්රිය එන්ජින් සඳහා ක්‍රමාලේඛනය කරන ලද ලොජික් පාලන යෙදවුම්**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ 20 දෙනෙක් සඳහා එක් CPD වැඩසටහනක් (පැය 50) පවත්වන ලදී. මේ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ශාලාවන්හි සේවය කරන පරීක්ෂකයින් සහ තාක්ෂණවේදීන් සහභාගි වූ අතර ඔවුන්ට PLC සහ ඒ හා සම්බන්ධ අතුරුමුහුණත් මොඩියුල නඩත්තු කිරීම සහ දෝෂ පිළිසකර කිරීම පිළිබඳ දැනුම ලබාදෙනු ලැබීය. සහභාගිවූවන්ට න්‍යාය පිළිබඳ දැනුම, සහ PLC භාවිතා වන දුම්රිය ඉන්ජින් ධාවනාගාර එදිනෙදා නඩත්තු කිරීමේ කාර්යයන් පිළිබඳ එක් එක් සංරචකව පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබාදීම කෙරෙහි මූලිකව අවධානය යොමු කරන ලදී.

Programmable ලොජික් පාලන පද්ධති



S7-1200 සහ S7-200 PLCs ආවරණය කරමින්, ඉංජිනේරුවන්, තාක්ෂණ නිලධාරීන් සහ උපාධි අපේක්ෂකයින්ගෙන් සමන්විත තාක්ෂණ මට්ටමේ පුද්ගලයින් 90 දෙනෙකු සඳහා දින 05 CPD පාඨමාලා 02 ක් පවත් වනු ලැබීය. මේ සඳහා සහභාගිවූවන් සඳහා කාර්මික පද්ධතිවල භාවිතා වන Program කළ හැකි

ලොජික් පාලන පද්ධති සහ HMI උපකරණ පිළිබඳ සෛද්ධාන්තික සහ ප්‍රායෝගික දැනුම ලබාදෙනු ලැබීය.

## 7.2. මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික පුහුණු

**ප්‍රායෝගික ඉලෙක්ට්‍රොනික පාඨමාලාව**



ආයතනයේ සාමාන්‍ය පුහුණු වැඩසටහනක් වන මෙය 27 වන වතාවට 60 දෙනෙකු සඳහා පවත්වනු ලැබීය. එමගින් විශේෂයෙන්ම ඒ සඳහා වැඩිදියුණු කරන ලද ප්‍රායෝගික සැසි සමගින් සහභාගිවන්නන්ට මූලික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ මනා දැනුමක් ලබාදේ. වැඩසටහනෙහි කාල සීමාව ආසන්න වශයෙන් මාස හයක් පමණ වේ.

**ඉලෙක්ට්‍රොනික පාඨමාලාව**

**30 දෙනෙකු සඳහා අවශ්‍යතාවය අනුව සැකසූ මධ්‍යම මට්ටමේ ඉලෙක්ට්‍රොනික පාඨමාලා දෙකක් පවත්වන ලදී.**

- කෘෂිකර්මාන්ත සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 13 දෙනෙක් සඳහා පවත්වන ලද පාඨමාලාව
- ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම සහ නාවික හමුදාවේ 17 දෙනෙක් සඳහා පවත්වන ලද පාඨමාලාව





**ප්‍රායෝගික තාරකා විද්‍යාව හඳුන්වාදීමේ වැඩමුළුව**

තාරකා විද්‍යාව හැඳින්වීමේ 20 වන වාර්ෂික වැඩමුළුව, 40 දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව ACCIMT හි දී පවත් වනු ලැබීය. මෙම වැඩමුළුවේ දී සහභාගිවූවන්ට සූර්යයා, සූර්යග්‍රහ මණ්ඩලය, තාරකාවක සම්භවය, අජටාකාශ විද්‍යාව පිළිබඳ දැනුම ලබාගැනීමට හැකිවිය. එසේම ඔවුන්ට ACCIMT හි ඇති නවීන තාරකා විද්‍යාත්මක දුරදක්නය මගින් නිරීක්ෂණය කිරීමේ අවස්ථාව ද හිමිවිය.




**උපාධි අපේක්ෂකයින් සඳහා තාරකා විද්‍යාත්මක දත්ත අවකරණය සහ විශ්ලේෂණය කිරීමේ (Astronomy Data Reduction and Analysis) වැඩමුළුව**

උපාධි අපේක්ෂකයින් 22 ක් සඳහා "තාරකා විද්‍යාත්මක දත්ත අවකරණය සහ විශ්ලේෂණය කිරීමේ ක්‍රම" හඳුන්වාදීමේ වැඩමුළුවක් පවත්වන ලදී. මෙහිදී සහභාගිවූවන්ට විවිධ තාරකා විද්‍යාත්මක දත්ත අවකරණ පැකේජ භාවිතා කිරීමේ ප්‍රායෝගික දැනුම ලබාගැනීමට හැකි වූ අතර එය ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු වලදී උපකාරී වනු ඇත.





## 7.3. විද්‍යාව සහ තාක්ෂණය ජනප්‍රිය කිරීම සහ තොරතුරු බෙදාහැරීම

**තාරකා විද්‍යාව සහ අභ්‍යවකාශ විද්‍යාව ජනප්‍රිය කිරීමේ වැඩසටහන්**

- **ජල රොකට් අධ්‍යාපනික වැඩමුළුව සහ ජල රොකට් තරගය**

ආසියා ශාන්තිකර කලාපීය අභ්‍යවකාශ නියෝජිතායතන සංසදය (APRSAF) සමඟ සහයෝගීතාවය ඇතිව ජල රොකට් වැඩමුළුව සහ සමුළුව සංවිධානයකර පවත්වනු ලැබීය. APRSAF ජාත්‍යන්තර මාර්ගගත ජල රොකට් තරගය සඳහා ශිෂ්‍යයින් 9 දෙනෙකු තෝරාගනු ලැබීය. මෙම මාර්ගගත ජල රොකට් තරගය මොරටුව විශ්වවිද්‍යාලීය ක්‍රීඩාපිටියේදී පවත්වන ලදී.

- **APRSAF ජාත්‍යන්තර පෝස්ටර් තරගය**



වයස අවුරුදු 8-11 අතර ශ්‍රී ලංකීය සිසුන් විසින් අඳින ලද පෝස්ටර් සමගින් ACCIMT සෑම වර්ෂයකම APRSAF ජාත්‍යන්තර පෝස්ටර් තරගය නියෝජනය කරයි. APRSAF සහ JAXA විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර පෝස්ටර් තරගය සඳහා පෝස්ටර් 3ක් යවනු ලැබීය.මැදිරිගිරිය ජාතික පාසලේ මිනෝෂි අමායා දළුවත්ත විසින් ඉදිරිපත් කරන ලද පෝස්ටරය මෙහිදී 2022 විශේෂ JAXA සම්මානය දිනාගනු ලැබීය.

- **තාක්ෂණ දැකබලා ගැනීම සඳහා ආයතනය මහජනතාව සඳහා විවෘත කිරීම.**

මෙමගින් පාසැල් සිසුන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරීන්, විශ්වවිද්‍යාල සිසුන්, පාසැල් ගුරුවරුන් ඇතුළු විශේෂ ජන කණ්ඩායම් අතර විද්‍යාව සහ තාක්ෂණය ජනප්‍රිය කරවීම අරමුණු කරයි. වසර 2022 දී, ආයතනට සංචාරය කළ ඉහත කාණ්ඩයන්ට අයත් 1000 කට වැඩි නරඹන්නන් පිරිසක් ආයතනයේ විශේෂඥතාවය ඇති ක්ෂේත්‍රයන්හි දේශණ සහ තාක්ෂණ ප්‍රදර්ශන සඳහා සහභාගි වූහ.



ජාතික ආරක්ෂක විද්‍යායතනයේ කාර්ය මණ්ඩලයේ සංචාරය



පාසල් සිසුන් අතර තාරකා විද්‍යා දැනුම ප්‍රචලිත කිරීම

## 7.4. ACCIMT පුස්තකාලය

ආයතනය සතුව ඉලෙක්ට්‍රොනික විද්‍යාව, සන්නිවේදනය,තොරතුරු තාක්ෂණය,රොබෝ විද්‍යාව සහ අභ්‍යවකාශ තාක්ෂණය යන තාක්ෂණික ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විෂයානුබද්ධ පොත්පත්,වාර්තා, අනෙකුත් ප්‍රකාශන සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපාංග (CD,DVD,VHS පට) වලින් සමන්විත අංගසම්පූර්ණ පුස්තකාලයක් පවතී.

තාවකාලික පදනම මත පුස්තකාලය විසින් ආයතනයට අනුබද්ධ කාර්යය මණ්ඩලයට හා අභ්‍යාසලාභීන්ට පුස්තකාල සේවා සපයන අතර පිටස්තර අධ්‍යාපනඥයින්ට,සිසුන්ට,ආයතනය මඟින් පවත්වන පුහුණු වැඩසටහන් වලට සහභාගී වෙන්නන්ට සහ පුස්තකාල සාමාජිකයින්ට විශේෂිත වූ පහසුකම්ද (Reference Services) ලබා දෙයි. මෙම සේවාවන්ට සමගාමීව පුස්තකාලය මඟින් ෆොටෝකොපි,ස්කෑන්,අන්තර්ජාල ප්‍රවේශය,අන්තර් පුස්තකාල සේවා වැනි උපකාරක සේවාවන්ද සපයයි.





# 8.0 මානව සම්පත් සංවර්ධනය

ආයතනය සඳහා වැටුප් කාණ්ඩ 15කට අයත් තනතුරු 51කට අයත් සමස්ත කාර්ය මණ්ඩල තනතුරු 177 ක් අනුමත කර තිබේ. 2022 වසර අවසානය වනවිට 177 ක් වන මෙම සමස්ත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 90 ක් සඳහා සේවා නියුක්තව සිටි අතර තනතුරු 87 ක් පුරප්පාඩුව පැවතුණි.

පුරප්පාඩුව පවතින තනතුරු වලින් බහුතරයක් සුදුසුකම් ලෙස ඉංජිනේරු සහ විද්‍යා අංශය ආශ්‍රිත උසස් උපාධියක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් මෙන්ම වසර කීපයක පළපුරුද්ද අවශ්‍ය කෙරෙන තාක්ෂණික ක්ෂේත්‍රයේ තනතුරු වේ.

සමාලෝචිත වසරේදී, එක් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරුවෙක්, පර්යේෂණ ඉංජිනේරුවන් තිදෙනෙක්, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවන් දෙදෙනෙකු සහ එක් පද්ධති ඉංජිනේරුවෙක් ඇතුළුව සේවකයින් 07 දෙනෙක් ඉල්ලා අස්විය. එසේම, අධ්‍යක්ෂවරයෙකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙක් සහ එක් කළමනාකරණ සහකාර නිලධාරියෙකු ඇතුළුව සේවකයින් 04 දෙනෙකු විශ්‍රාම යනු ලැබීය.

කාර්ය පටිපාටික රීති අනුගමනය කර ආයතන සංග්‍රහයේ II වන වෙළුම යටතේ විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එක් සේවකයෙකු සේවයෙන් පහකරන ලදී.




දැනට සිටින කාර්ය මණ්ඩලය - 90
පුරප්පාඩු - 87




දැනට සිටින කාර්ය මණ්ඩලය - 40
පුරප්පාඩු - 24




දැනට සිටින කාර්ය මණ්ඩලය - 50
පුරප්පාඩු - 63



# 9.0 2022 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

(02)

**නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ආදායම** | | | |
| රජයේ ප්‍රදාන | (01) | 197,785,906.86 | 205,428,016.74 |
| වෙනත් ආදායම | (02) | 47,215,033.45 | 24,772,746.88 |
| මුළු ආදායම | | **245,000,940.31** | **230,200,763.62** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | (03) | 130,592,290.47 | 123,762,364.90 |
| ගමන් වියදම | (04) | 598,380.67 | 118,548.26 |
| සැපයුම් හා අවශ්‍යතා | (05) | 1,700,729.41 | 840,198.89 |
| අළුත්වැඩියාවන් හා නඩත්තු | (06) | 41,332,498.88 | 42,159,765.43 |
| උපයෝජන හා වෙනත් සේවාවන් | (07) | 14,554,971.08 | 19,251,255.61 |
| ව්‍යාපෘති වියදම් | (08) | 22,036,444.97 | 13,959,795.55 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | (09) | 2,459,757.18 | 22,069,563.95 |
| වෙනත් මෙහෙයුම් වියදම් | (10) | 171,809.54 | 333,954.06 |
| මුළු වියදම් | | **213,446,882.20** | **222,495,446.65** |
| **අදාල කාලය සඳහා අතිරික්තය /(හිඟය)** | | **31,554,058.11** | **7,705,316.97** |
| 2022.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා ආදායම් හා වියදම් විසර්ජන ගිණුම | | | |
| අදාල කාලය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය) | | 31,554,058.11 | 7,705,316.97 |
| PC ගිණුම් වලින් උත්පාදනය වූ අරමුදල් වලින් අතිරික්තය ( | **උපලේඛණය 01** | (5,634,883.02) | (2,355,830.21) |
| **වසර සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)** | | **25,919,175.09** | **5,349,486.76** |

පිටු අංක 6 සිට 13 දක්වා වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය**

| | සටහන් | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදලට සමාන දෑ | **(11)** | 14,832,762.44 | 19,634,386.16 |
| කෙටිකාලීන ආයෝජන | **(12)** | 101,070,491.18 | 80,146,146.95 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | **(13)** | 22,115,032.17 | 16,132,031.42 |
| භාණ්ඩ වට්ටෝරු/තොග | **(14)** | 9,794,874.53 | 9,790,415.43 |
| පූර්ව ගෙවීම් | **(15)** | 3,765,700.05 | 375,539.01 |
| | | 151,578,860.37 | 126,078,518.97 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | **(13.3)** | 9,672,890.00 | 9,042,870.00 |
| දේපළ පිරියත හා උපකරණ | **(16)** | 189,050,790.88 | 217,659,197.60 |
| සිදු කෙරෙමින් පවත්නා කාර්යයන් (ඉදිකිරීම්) | **(17)** | 3,545,744.40 | 3,545,744.40 |
| | | 202,269,425.28 | 230,247,812.00 |
| **මුළු වත්කම්** | | 353,848,285.65 | 356,326,330.97 |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | **(18)** | 12,669,127.77 | 12,745,888.74 |
| සම්චිත වියදම් | **(19)** | 4,801,870.75 | 3,768,840.40 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් (වසරක් තුළ) | **(20 a )** | 2,715,812.50 | 2,761,555.00 |
| | | 20,186,811.02 | 19,276,284.14 |
| ජංගම නොවන වගකීම් | | | |
| විලම්භිත ආදායම් | | 3,665,688.56 | 2,024,713.56 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | **(20 b)** | 48,655,401.13 | 50,073,535.05 |
| | | 52,321,089.69 | 52,098,248.61 |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| රජය විසින් දායකවූ ප්‍රාග්ධනය | **(21)** | 289,442,688.10 | 322,052,586.25 |
| සංචිත | **(22)** | 84,416,883.23 | 81,021,192.69 |
| සම්චිත හිඟය | **(23)** | (92,519,186.39) | (118,121,980.72) |
| | | 281,340,384.94 | 284,951,798.22 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | 353,848,285.65 | 356,326,330.97 |
| | | - | - |

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමි .

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ .

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනු ලබන්නේ ,

| | | |
|---|---|---|
| **සභාපති** | **අධ්‍යක්ෂ ජනරාල් / ප්‍ර.වි.නි** | **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ** |
| **2023 පෙබරවාරි 28** | | **(මුදල් )** |

පිටු අංක 6 සිට 13 දක්වා වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි .

(04)

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**<u>2022 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය</u>**

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | **2022** | **2021** |
| | රු. | රු. |
| අදාල කාලය සඳහා අතිරික්තය / (හිඟය) | 25,919,175.09 | 5,349,486.76 |
| | | |
| මූල්‍යමය නොවන ගනුදෙනු | | |
| ක්ෂයකිරීම් | 32,476,149.68 | 34,896,452.79 |
| ක්‍රමක්ෂය | (32,476,149.68) | (34,896,452.79) |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | 5,614,682.84 | 5,773,028.43 |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන | 3,019,646.08 | 4,150,710.51 |
| සමුච්චිත ලාභය ගැලපීම් | - | 46,440.53 |
| පොලී ආදායම - ස්ථාවර තැන්පතු | (4,575,165.29) | (1,106,412.21) |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | (1,737,873.61) | (545,807.38) |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන ප්‍රදාන | (2,459,757.18) | (22,051,563.95) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව) | **25,780,707.93** | **(8,384,117.31)** |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම)/ අඩුවීම | (11,597,683.59) | 19,640,388.48 |
| භාණ්ඩ වට්ටෝරු ලේඛණ වල (වැඩිවීම)/ අඩුවීම | (4,459.10) | 157,930.58 |
| පූර්ව ගෙවීම් වල (වැඩිවීම)/ අඩුවීම | (3,390,161.04) | 1,923,962.85 |
| ගෙවිය යුතු දෑ වල (වැඩිවීම)/ අඩුවීම | (76,760.97) | 2,342,792.71 |
| උපචිත වියදම් වල වැඩිවීම/ (අඩුවීම) | 1,033,030.35 | (3,758,985.42) |
| මෙහෙයුම් මගින් උත්පාදනය වූ මුදල් | **11,744,673.58** | **11,921,971.89** |
| ගෙවන ලද නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් වියදම් | (4,483,522.50) | (994,160.00) |
| ලද පොලී ආදායම - ස්ථාවර තැන්පතු | 4,575,165.29 | 1,106,412.21 |
| ලද පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 1,737,873.61 | 545,807.38 |
| වත්කම් අපහරණය මත ලාභය/ පාඩුව | - | - |
| විලම්භිත ආදායම | 1,640,975.00 | (9,181,877.44) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින්/ (සඳහා යොදාගත්) ශුද්ධ මූල්‍ය | **3,470,491.40** | **(8,523,817.85)** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් / (සඳහා යොදාගත්) මූල්‍ය ප්‍රවාහ** | | |
| දේපල, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම් | (3,867,742.96) | (1,233,397.51) |
| කෙටිකාලීන ආයෝජන | (20,924,344.23) | (14,083,268.87) |
| කාර්ය මණ්ඩලය ණය සංචලීකරණය | (630,020.00) | 1,535,167.00 |
| දේපළ, පිරියත හා උපකරණ අපහරණය මගින් ලද මුදල් | - | - |
| සිදුකරන ප්‍රාග්ධන වැඩ සංචලීකරණය | - | 110,264.00 |
| ආයෝජන ක්‍රියාකාරකම් මගින්/(භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ | **(25,422,107.19)** | **(13,671,235.38)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් /(භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් මගින් මුදල් | 2,295,000.00 | 11,740,000.00 |
| ප්‍රාග්ධන අමාත්‍යාංශ ප්‍රදානයන් මගින් මුදල් | - | - |
| සංචලීකරණ සංචිත | 3,110,318.49 | 2,321,579.22 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් /(භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ** | **5,405,318.49** | **14,061,579.22** |
| **මුදල් හා මුදලට සමානදෑ ශුද්ධ වැඩිවීම /(අඩුවීම)** | **(4,801,623.72)** | **3,788,497.88** |
| | | |
| වසර ආරම්භයේ තිබූ මුදල් හා මුදලට සමාන දෑ | 19,634,386.16 | 15,845,888.28 |
| **වසර අවසානයේ ඇති මුදල් හා මුදලට සමාන දෑ** | **14,832,762.44** | **19,634,386.16** |

(05)

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

Rs. 000s

| | රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | රජයේ ප්‍රාග්ධන ප්‍රදාන (බිල් නොවන) | අමාත්‍යාංශ ප්‍රාග්ධන ප්‍රදානය | පොදු සංචිතය | සෙල්ටෙල් පරිත්‍යාගය | R & C අරමුදල | විශේෂ ප්‍රදානය | ප්‍රත්‍යාගණන අතිරික්තය | පර්යේෂණ සංචිතය | වෙනත් ප්‍රදාන හා පරිත්‍යාග | ප්‍රත්‍යාගණන අරමුදල | අධ්‍යක්ෂවරයාගේ අරමුදල | FINDS ප්‍රදානය | NASDA ප්‍රදානය | සමුච්චිත අතිරික්තය/ (හිඟය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | 353,668 | 133 | 13,156 | 273 | 213 | 1,341 | 3,464 | 26,683 | 206 | 23,066 | 14,657 | 1,611 | 8,255 | 8 | (124,246) | 322,488 |
| ලැබුණු අදානයන් | 11,740 | | | | | | | | | | | | | | | 11,740 |
| ක්ෂයක්ෂය | (34,460) | (133) | | | | | | | | | | | | | | (34,593) |
| ධාරිතා වර්ධන වැඩසටහන් | (22,052) | | | | | | | | | | | | | | | (22,052) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන මත ලැබීම් | | | | | | | | | | | | | | | | 0 |
| ස්ථාවර වත්කම්/ මෙවලම් | | | | | | | | | | | | | | | | 0 |
| ක්ෂයකිරීම | | | | | | | | | | (302) | | | | | | (302) |
| වෙනත් ලැබීම් | | | | | | | | | | | 429 | | | | | 429 |
| පොලී ආදායම් | | | | | | | | | | | 608 | 88 | 426 | 0 | | 1,122 |
| ගැලපීම් | | | | | | | | | | | | | | | 775 | 775 |
| වියදම් | | | | | | | | | (4) | | | | | (0) | | (4) |
| කාලසීමාව සඳහා අතිරික්තය | | | | | | | | | | | | | | | 5,349 | 5,349 |
| 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය | 308,896 | 0 | 13,156 | 273 | 213 | 1,341 | 3,464 | 26,683 | 202 | 22,764 | 15,694 | 1,699 | 8,681 | 7 | (118,122) | 284,951 |
| | | | | | | | | | | | | | | | | 284,951 |
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | 308,896 | 0 | 13,156 | 273 | 213 | 1,341 | 3,464 | 26,683 | 202 | 22,764 | 15,694 | 1,699 | 8,681 | 7 | (118,122) | 284,951 |
| ලැබුණු අදානයන් | 2,295 | | | | | | | | | | | | | | | 2,295 |
| ක්ෂයක්ෂය | (32,445) | | | | | | | | | (31) | | | | | | (32,476) |
| ධාරිතා වර්ධන වැඩසටහන් | (2,460) | | | | | | | | | | | | | | | (2,460) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන මත ලැබීම් | | | | | | | | | | | | | | | | 0 |
| ස්ථාවර වත්කම්/ මෙවලම් | | | | | | | | | | | | | | | | 0 |
| ක්ෂයකිරීම | | | | | | | | | | | | | | | | 0 |
| වෙනත් ලැබීම් | | | | | | | | | 33 | | 723 | | | | | 756 |
| පොලී ආදායම් | | | | | | | | | | | 1,634 | 123 | 913 | 0.216 | | 2,670 |
| ගැලපීම් | | | | | | | | | | | | | | | (316) | (316) |
| වියදම් | | | | | | | | | | | | | | (0.025) | | (0) |
| කාලසීමාව සඳහා අතිරික්තය | | | | | | | | | | | | | | | 25,919 | 25,919 |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | **276,286** | **0** | **13,156** | **273** | **213** | **1,341** | **3,464** | **26,683** | **235** | **22,733** | **18,051** | **1,822** | **9,594** | **8** | **(92,519)** | 281,340 |

# නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට

**සාමාන්‍ය ප්‍රතිපත්ති**

**වාර්තාකරණ ආයතනය**

1994 අංක 04 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ ස්ථාපිත නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (මෙහි මින්මතු "ආයතනය" ලෙස හඳුන්වනු ලබන) මොරටුව, කටුබැද්ද බණ්ඩාරනායක මාවතේ පිහිටා ඇත.

**ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය**

ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ;

**අ. ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණය හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා,**

i. නවීන තාක්ෂණයන් යොදාගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ආරම්භ කිරීම, දිරිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

ii. රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන කාර්යයන් සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන සහය ලබාදීම.

iii. රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන කාර්යයන්වලදී නවීන තාක්ෂණය පිළිබඳව පුද්ගලයන් පුහුණු කිරීම.

**ආ. අනාගත අධ්‍යයනයන් දිරිමත් කිරීම .**

සන්නිවේදනය හා අදාල විද්‍යාවන් ඇතුළු නවීන තාක්ෂණයන්, තොරතුරු තාක්ෂණය , ඉලෙක්ට්‍රොනික විද්‍යාව ,වකාශ තාක්ෂණයඅභ්‍ය ,වනික විද්‍යා ඉලෙක්ට්‍රොක්ෂුද්‍ර ,විදුලි සංදේශනය , රොබෝ විද්‍යාව ,පොටෝනික්ස් හා නව ද්‍රව්‍ය යන ක්ෂේත්‍ර නවීන තාක්ෂණයන්ට අයත්වේ .

**සේවක සංඛ්‍යාව**

වාර්තා කරනු ලබන කාලය අවසානයේදී සේවයේ නියුතු ස්ථිර සේවකයන් සංඛ්‍යාව 90 කි.

**පිළියෙල කිරීමේ පදනම**

**1) අනුකූලතා ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශන සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශය මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුලත්වේ. මෙම ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඇත.

# නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට

**2) මිණුම් සඳහා පදනම**

අදාල සටහන් යටතේ සාධාරණ අගයන් පිළිබඳව සුදුසු අනාවරණයන් සිදු කරනු ලබන අවස්ථාවලදී හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පය මත පිළියෙල කර ඇත.

**3) තුලනාත්මක තොරතුරු**

වත්මන් කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම හා අන්තර්කාලීන තුලනය වැඩිදියුණු කිරීම සඳහා පසුගිය කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය වී ඇති සියලුම අගයන් පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත, ඒ සඳහා හේතු වූ කරුණු හා විස්තරාත්මක කරුණු තුලනාත්මක තොරතුරු වලට ඇතුලත්වේ.

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර ඇති සියලු කාල සීමාවන්වලට අනුකූල වන ලෙස යොදාගෙන ඇත.

**4) මෙහෙයුම් කරන හා ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය**

මූල්‍ය ප්‍රකාශන ආයතනයේ ව්‍යවහාර කරන හා ගිණුම් ඉදිරිපත් කරනු ලබන මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබේ.

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු ආසන්න දහස් සංඛ්‍යාවෙන් දක්වනු ලැබේ.

**5) ඇස්තමේන්තු හා විනිශ්චයන්ගේ ප්‍රයෝජන**

කළමනාකාරිත්වයට ගිණුම් ප්‍රතිපත්ති යෙදවුම හා වාර්තා වූ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් කෙරෙහි බලපාන විනිශ්චයන් තක්සේරු කිරීම හා උපකල්පන කිරීම සඳහා SLPSAS ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීම හා අවශ්‍ය කෙරේ. සත්‍ය වියදම් මෙම ඇස්තමේන්තු හා යොදාගත් විනිශ්චයන්ගෙන් වෙනස්විය හැක.

ඇස්තමේන්තු හා වැදගත් උපකල්පනයන් සිදුකරගෙන යන පදනම මත සමාලෝචනය කෙරේ. සංශෝධන ඒවා සිදුකරනු ලැබූ කාලය තුලදී පමණක් හෝ සංශෝධනය සිදු කරනු ලබන කාලය තුලදී හා අනාගත කාලයේදී, සංශෝධන මගින් වර්තමාන හා අනාගත කාලයක් යන දෙකම සඳහා බලපාන්නේ නම් ඇස්තමේන්තු සංශෝධන සිදුකරන විට ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන හඳුනා ගැනේ.

ඇස්තමේන්තු වල වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු, මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් ප්‍රමාණ කෙරෙහි වඩා වැදගත් බලපෑම් ඇතිකරනු ලැබ ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී සිදුකරණ අවිනිශ්චිත හා වැදගත් විනිශ්චයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වල ඇතුලත්වේ.

(8)

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

## <u>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට</u>

**වත්කම් හා ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම**

**6) දේපල, පිරියත හා උපකරණ**

**(6.1) හඳුනා ගැනීම හා මැනීම**

දේපල, පිරියත හා උපකරණවලට අයත් අයිතම පිරිවැය ලෙස හෝ සමුච්චිත ක්ෂයවීම් අඩුකර සාධාරණ අගයක් ලෙස දැක්වේ.

දේපල, පිරියත හා උපකරණවලට අයත් සියළු අයිතම, සමුච්චිත ක්ෂයවීම් අඩුකර පිරිවැය අනුව මූලිකව සටහන් කරනු ලැබේ. වත්කමක වැදගත් අංග වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ක්ෂය කිරීම සිදු කෙරේ. දේපල, පිරියත හා උපකරණ වල වැදගත් කොටස් යම් කාල පරාසයකදී ප්‍රතිස්ථාපනය කල යුතු වූ විට ආයතනය මගින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස අත්හැර දමා නව කොටස හා එමගින් ප්‍රයෝජන ලබන කාලය හා ක්ෂයවීම පිළිබඳව සලකා බලනු ලැබේ. වෙනත් සියළු අළුත්වැඩියාවන් හා නඩත්තු වියදම් දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ දැක්වේ.

**(6.2) පිරිවැය**

දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ වියදම් හා ඒ හා සම්බන්ධ වෙනත් හදිසි වියදම් පිරිවැය වේ.

දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීමේ වියදම හා එම වත්කම එමගින් අපේක්ෂා කරන කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට ගෙන ඒමට ඍජු ලෙස දරන ලද වියදම් වලින් එකී පිරිවැය සමන්විත වේ.

වත්කමක් පවත්වා ගෙන යාම හෝ එමගින් මුදල් ඉපයීමේ ධාරිතාවය ඉහල නැංවීම සඳහා ස්ථාවර ආකාරයේ වත්කමක් අත්පත් කරගැනීම, එය පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා තදනන්තරව දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ප්‍රධාන පිරික්සුම්, පිළිසකර කිරීමේ වියදම් ඇතුළුව දේපල, පිරියත හා උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වෙන් වශයෙන් දරන ලද වියදම මුදල් බවට පත් කෙරේ. එකී කොටස් මගින් ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබාදීමේ ප්‍රවනතාවයක් ඇත්නම් හා එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකි නම් පමණක් වෙනත් තදන්තර වියදම් මුදල් බවට පත්කෙරේ.

ආයතනය පිහිටි ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දේපලක් වන අතර එය ආයතනයේ කටයුතු සිදුකරගෙන යාම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට පවරනු ලැබ ඇති බැවින් ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සඳහන් නොවේ. ආයතනය හා මොරටුව විශ්වවිද්‍යාලය අතර එළඹ ඇති අවබෝධතා ගිවිසුම අනුව, ආයතනයේ කටයුතු දිගටම සිදුකරමින් පවත්වාගෙන නොයන්නේ නම්, ඉඩම මොරටුව විශ්වවිද්‍යාලයට භාරදිය යුතුය.

(9)

**නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය**

**<u>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට</u>**

**(6.3) ක්ෂය කිරීම්**

සින්නක්කර ඉඩම් හා සිදු කෙරෙමින් පවතින ඉදිකිරීම් සඳහා ක්ෂයවීම් ගනණය කරනු නොලැබේ. වෙනත් සියළු දේපල, යන්ත්‍ර හා උපකරණවල පිරිවැය සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය අනුව සෘජු රේඛා පදනම මත පහත දැක්වෙන ලෙස සමාන වාරික වලින් ක්ෂයවීම්

| වත්කම් කාණ්ඩය | % වසරක් සඳහා ප්‍රතිශතය |
|---|---|
| ගොඩනැගිලි | 5 |
| පරිගණක හා උපාංග | 20 |
| චන්ද්‍රිකා ඇන්ටනා, පර්යේෂණාගාර උපකරණ | 10 |
| කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ හා උපාංග | 10 |
| මෝටර් රථ | 20 |
| පුස්තකාල පොත් | 15 |

ගණනය කරනු ලැබේ.අත්පත් කරගනු ලැබූ වත්කමක් ක්ෂයවීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනයට ගත හැකි අවස්ථාවේ සිට වන අතර, ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම් වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත් කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය.

**(7) භාණ්ඩ වට්ටෝරු**

භාණ්ඩ වට්ටෝරු පොත්, ලිපිද්‍රව්‍ය, තොග අයිතම, ඉලෙක්ට්‍රොනික උපාංග හා මෙවලම් ආදියෙන් යුක්ත වේ.

භාණ්ඩ සඳහා අඩුම මිල හා ශුද්ධ උපලබ්ධි වටිනාකම භාණ්ඩ වට්ටෝරුවල සඳහන්වේ. ශුද්ධ උපලබ්ධි වටිනාකම වන්නේ භාණ්ඩය නිමකිරීම හා විකිණීම සඳහා වන වියදම් අඩුකල සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ඇස්තමේන්තුගත විකිණුම් මිලවේ.

**(8) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ**

බොල් ණය හා සැක සහිත ලැබිය යුතු දෑ සඳහා වන  දීමනා වල ශුද්ධ අගය උපලබ්දි වීම සඳහා ඇස්තමේන්තු කරණ ලද අගයෙන් වෙළඳ හා ලැබිය යුතු දෑ දක්වනු ලැබේ.

වෙනත් ලැබිය යුතු දෑ හා අදාල පාර්ශව වෙතින් ලැබිය යුතු දෑ, බොල් ණය හා සැකසහිත ලැබිය යුතු දෑ සඳහා වන දීමනා අඩුකර ලැබෙන පිරිවැයවේ.

සාමාන්‍ය බොල් ණය ප්‍රතිපාදන පහත පරිදි තීරණය කරණු ලැබේ:

| ඉකුත් වූ කාල සීමාව | අවශ්‍ය ප්‍රතිපාදන |
|---|---|
| වසර 1-2 | 50% |
| වසර 2-3 | 75% |
| වසර 3ට වැඩි | 100% |

(10)

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට

**(9) ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත් සඳහා සිදුකල ආයෝජන පිරිවැය මගින් දක්වා ඇත. එකී ආයෝජන වල ආදායම උපචිත පදනම යටතේ ගිණුම්ගත කර ඇත.

**(10) මුදල් හා මුදලට සමාන දෑ**

මුදල් හා මුදලට සමාන දෑ වන්නේ අත ඇති මුදල්, අවශ්‍ය විටක ආපසු ගත හැකි තැන්පතු හා කෙටි කාලීන දැඩි ද්‍රවශීල ආයෝජන, දන්නා ප්‍රමාණයෙන් ක්ෂණිකව මුදල් බවට පරිවර්තනය කල හැකි හා අගය වෙනස්වීමේ අවදානමට ලක්වීම නොසලකා හැරිය හැකි දේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ වලට අත ඇති මුදල් හා බැංකු අයිරා ද ඇතුලත්ව තැන්පතුවල ඇති මුදල් ඇතුලත්වේ. කෙටි කාලයකදී කල්පිරෙන ආයෝජන ද (උදා - අත්පත් කර ගන්නා දිනයේ පටන් මාස 3 ක් හෝ ඊට අඩු කාලයක්) මුදලට සමාන දෑ ලෙස සැලකේ.

**(11) වගකීම් හා ප්‍රතිපාදන**

ඉල්ලුම් කරන පරිදි ගෙවීමට ඇති මුදල් හෝ වාර්තා කරන දිනයේ සිට වසරක් ඇතුලත ගෙවීමට ඇති මුදල් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණ කෙරේ. වාර්තා කරනු ලබන දිනයේ පටන් වසරකට පසුව ගෙවිය යුතු ශේෂය ජංගම නොවන වගකීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී දන්නා සියළුම වගකීම් සැලකිල්ලට ගෙන ඇත. පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ අනපේක්ෂිත ගෙවීම් කිරීමට ඇති විට ප්‍රතිපාදන හා වගකීම් හඳුනා ගැනෙන අතර වගකීම් ඉටුකිරීම සඳහා ආර්ථිකමය ප්‍රතිලාභ ලබාගැනීමක් අවශ්‍ය විය හැක.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට

**(12) සේවක ප්‍රතිලාභ**

**(12.1) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්**

විශ්‍රාම ප්‍රතිලාභ යනු නිර්වචිත ප්‍රතිලාභ සැලසුමකි. මෙම වගකීම් ඉටුකිරීම සඳහා වන ප්‍රතිපාදන මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඉදිරියට ගෙන යනු ලැබේ. අනාගත පඩි වැඩිවීමේ අනුපාත, වට්ටම් අනුපාත හා අපේක්ෂිත කාර්යමණ්ඩල පිරිවැටුම් අනුපාත සලකාබලා සූත්‍ර ක්‍රමය පදනම් කරගෙන ප්‍රතිපාදන ගණනය කරනු ලැබීය. (මේ පිළිබඳ වන උපකල්පනයන් 11.1 සටහන මගින් දැක්වේ) වසර ආරම්භයේ ඉදිරියට ගෙනා ප්‍රතිපාදන හා වසර අවසානයේ ඉදිරියට ගෙනා ප්‍රතිපාදන අතර ඇතිවන වෙනස පිළිබඳව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් කටයුතු කෙරේ. නමුත් 1983 අංක 12 දරන විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමේ පනත අනුව විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බාහිරව ප්‍රදානයන් සිදු නොකෙරේ. මෙම වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් යටතේ කාණ්ඩකර තිබේ .

**(12.2) සේවක අර්ථසාධක අරමුදල ( EPF)**

අනුමත අර්ථසාධක අරමුදල සඳහා සෑම සේවකයෙකු සඳහාම ආයතනය මඟින් හා සේවකයින්ගේ වැටුප මඟින් පිළිවෙලින් 15% ක හා 10%ක දායකත්වයක් ලබාදේ.

**(12.3) සේවක භාරකාර අරමුදල (ETF)**

සේවක භාරකාර අරමුදල සඳහා ආයතනය මගින් සෑම සේවකයෙකුගේම වැටුපෙන් 3%ක් දායක කෙරේ.

**(13) වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ**

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැය අනුව දක්වා ඇත.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට

**(14) බදුකරණය**

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 7 (ආ) (ii) වගන්තිය යටතේ මෙම ආයතනය ආදායම් බදු වලින් නිදහස් කර ඇත. එකතු කල අගය මත බදු (VAT) සඳහා ආයතනය ලියාපදිංචි වී ඇත. පාඨමාලා මගින් ලැබෙන ආදායම හැර ව්‍යාපෘති ආදායම හා වෙනත් ආදායම් සඳහා VAT ගෙවිය යුතුය.

**(15) ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය වගකීම්**

අවිනිශ්චිත වගකීම් යනු ආර්ථික ප්‍රතිලාභ ලැබිය නොහැකි හෝ සත්‍ය ලෙස මැනිය නොහැකි විට අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් තහවුරු කරගත හැකි සිදුවීමේ ප්‍රවණතාවයක් ඇති බැඳීම් වේ. ආයතනයේ ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිත වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල අදාල සටහන් මගින් අනාවරණය කර ඇත.

**(16) ප්‍රදානයන් ගිණුම්කරණය**

ආයතනය දරන ලද වියදම් සඳහා ආයතනයට වන්දි ලබාදෙන ප්‍රදානයන්, වියදම් හඳුනාගත් සමාන කාලසීමාව සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. වත්කමක් සඳහා වන වියදමක් ලෙස ආයතනයට වන්දි ලබාදෙන ප්‍රදානයන් අදාල වත්කම සඳහා ප්‍රයෝජනවත් ආයුකාලය සම්බන්ධ ක්‍රමානුකූල පදනම මත ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

**(17) විශේෂ ව්‍යාපෘති වලට අදාල ප්‍රදානයන්**

හඳුනාගත් ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකමක් සඳහා භාවිතා කිරීමට ප්‍රදානයන්/පරිත්‍යාග ලැබෙන විට, එකී අරමුදල් සීමාකරන ලද අරමුදලක රඳවාගෙන, එම හඳුනාගත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වියදම් දරන ලද වියදම් සමඟ ගැලපෙන ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට මාරුකරනු ලැබේ. භාවිතයට නොගන්නා ලද අරමුදල් ඒවාට අදාල අරමුදල් ගිණුම් වල රඳවා තබා ගනු ලබන අතර, ඒවා අවශ්‍ය වන පරිදි එකී කාල සීමාවක් තෙක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ සමුච්චිත අරමුදල් සහ සංචිත යටතේ ඇතුළත් කරනු ලැබේ.

**(18) ආදායම් හඳුනා ගැනීම**

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ලබාදිය හැකි හා විශ්වාසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණය අනුව ආදායම හඳුනාගනු ලැබේ.

අ) සිසුන්ගෙන් ලැබෙන පාඨමාලා ගාස්තු උපචිත පදනම යටතේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

ආ) ව්‍යාපෘති ආදායම, උපදේශක ආදායම උපචිත පදනම යටතේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

ඇ) පොලී ආදායම උපචිත පදනම යටතේ හඳුනා ගැනේ.

ඉ) දායකත්වය පාලනය කල යුතු හෝ දායකත්වය ලැබීමේ අයිතිය තහවුරු කරනු ලැබූවිට ප්‍රදානයන්ට අදාල ආදායම ඇතුලත් කෙරේ.

ඊ) වෙනත් ආදායම් උපචිත පදනම යටතේ හඳුනා ගැනේ.

(13)

**නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට**

**(19) ව්‍යාපෘති වල අතිරික්ත ආදායම උපයෝජනය**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සාමාන්‍යයෙන් ඇතුලත් ක්‍රියාකාරකම් වලට අමතරව සිදුකරන ලද ව්‍යාපෘති මගින් ලැබෙන අතිරික්ත ආදායම විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සඳහා අදාලවන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380 අනුකූලව උපයෝජනය කෙරේ.

**(20) වියදම**

අ) දරනු ලැබූ වියදම් හා විශේෂ ආදායම් අයිතම මගින් වන ඉපයීම් අතර ඇති සෘජු සම්බන්ධය පදනම් කරගෙන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම් හඳුනා ගනු ලැබේ. ආයතනය පවත්වාගෙන යාම හා ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම ලෙස නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම්, වසර සඳහා අතිරික්තයක් ගෙන දෙන අවස්ථාවන්හිදී ආදායම් වලට එරෙහිව අයකර තිබේ.

ආ) පාඨමාලා, ව්‍යාපෘති හා උපදේශන කාර්යයන් හා වෙනත් ක්‍රියාකාරකම් සඳහා වන වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ උපචිත පදනම යටතේ හඳුනා ගනු ලැබේ.

**(21) මුදල් ප්‍රවාහ ප්‍රකාශ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශ SLPAS 2 ට අනුකූලව පිළියෙල කර ඇත.

**(22) වාර්තා කරන දිනයට පසුව වන සිදුවීම්**

වාර්තා කරන දිනයට පසුව සිදුකරන ක්‍රියාකාරකම් වල අදාලත්වය පිළිබඳව සලකා බලා අවශ්‍ය විටක ගිණුම්වල සුදුසු පරිදි ගැලපීම් කර ඇත.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛණය - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස )**

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **(01 ) ආදායම - රජයේ ප්‍රදාන** | | |
| ක්‍රමක්ෂය | 32,476,149.68 | 34,896,452.79 |
| රජයේ ප්‍රදාන - ධාරිතා වර්ධනය | 2,459,757.18 | 22,051,563.95 |
| පුනරාවර්තන ප්‍රදාන | 162,850,000.00 | 148,480,000.00 |
| | 197,785,906.86 | 205,428,016.74 |
| **(02) වෙනත් ආදායම** | | |
| පාඨමාලා ගාස්තු | 21,287,975.00 | 83,400.00 |
| පොලී ආදායම (ආයතනික ණය) | 580,089.43 | 620,425.07 |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම | 4,575,165.29 | 1,106,412.21 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම | 1,737,873.61 | 545,807.38 |
| වත්කම් අපහරණය මගින් ලාභය | - | - |
| ව්‍යාපෘති ආදායම / උපදේශන ආදායම | 13,780,278.42 | 20,647,007.99 |
| වෙනත් ආදායම | 1,395,645.30 | 1,341,422.94 |
| විවිධ ආදායම් | 3,825,006.40 | 428,271.29 |
| ටෙන්ඩර තැන්පතු | 33,000.00 | - |
| | 47,215,033.45 | 24,772,746.88 |
| **(03) පුද්ගල පඩිනඩි** | | |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා දීමනා | 216,000.00 | 265,500.00 |
| E.P.F. | 11,414,439.98 | 11,901,583.76 |
| E.T.F. | 2,282,888.04 | 2,380,316.27 |
| ඉංජිනේරු දීමනාව | 4,308,214.29 | 4,722,532.00 |
| ඉන්ධන දීමනාව | 7,637,400.00 | 3,358,939.00 |
| විශ්‍රාම පාරිතෝෂික | 3,019,646.08 | 4,150,710.51 |
| වෙනත් දීමනා | 3,487,133.33 | 2,102,911.00 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 2,006,675.75 | 1,430,889.90 |
| වෘත්තීය දීමනාව | 2,064,830.00 | 2,106,000.00 |
| වැටුප් හා වේතන | 81,316,092.87 | 79,070,847.46 |
| වාහන දීමනාව | 8,623,333.34 | 8,646,774.00 |
| වාටඩ් දීමනාව | 1,320,000.00 | 1,291,834.00 |
| දුරකතන දීමනාව | 1,731,676.79 | 2,333,527.00 |
| පර්යේෂණ දීමනාව | 1,163,960.00 | - |
| | 130,592,290.47 | 123,762,364.90 |
| **(04) ගමන් වියදම්** | | |
| ගමන් වියදම් - දේශීය | 185,336.62 | 118,548.26 |
| ගමන් වියදම් - ජාත්‍යන්තර | 413,044.05 | - |
| | 598,380.67 | 118,548.26 |

(15)

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛණය - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස)**

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **(05) සැපයුම් හා අවශ්‍යතා** | | |
| ප්‍රදර්ශන හා සමුළු | - | 1,500.00 |
| ඉන්ධන | 359,028.59 | 59,321.62 |
| යාන්ත්‍රික හා විද්‍යුත් භාණ්ඩ/ විද්‍යාගාර උපාංග | 26,040.90 | 17,926.45 |
| වාර සඟරා | - | - |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 588,661.38 | 241,675.00 |
| තොග හානි | 41,766.04 | 75,945.34 |
| නිල ඇඳුම් | 108,000.00 | 108,000.00 |
| සුභ සාධක අයිතම | 577,232.50 | 335,830.48 |
| | 1,700,729.41 | 840,198.89 |
| **(06) අළුත්වැඩියාවන් හා නඩත්තු** | | |
| ගොඩනැගිලි | 5,689,157.16 | 5,343,376.74 |
| පරිගණක | 225,500.00 | 451,170.00 |
| ක්ෂය කිරීම් | 32,476,149.68 | 34,896,452.79 |
| විද්‍යාගාර උපකරණ | 118,433.47 | 510,086.01 |
| 100KVA විදුලි ජනකය | 372,362.00 | 43,000.00 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | - | - |
| මෝටර් රථ | 704,526.47 | 121,601.06 |
| කාර්යාල උපකරණ | 1,746,370.10 | 794,078.83 |
| | 41,332,498.88 | 42,159,765.43 |
| **(07) ප්‍රවාහනය, සන්නිවේදනය** | | |
| **උපයෝගිතා හා වෙනත් සේවාවන්** | | |
| වෙළඳ දැන්වීම් | 220,050.00 | 502,551.00 |
| විගණන ගාස්තු | 624,800.00 | 300,000.00 |
| බැංකු ගාස්තු | 18,350.00 | 27,620.00 |
| විදුලිය | 3,850,725.59 | 2,854,778.40 |
| සත්කාරක හා විනෝදාස්වාද | 98,614.15 | 59,763.25 |
| රක්ෂණ | 487,352.84 | 3,607,683.62 |
| බලපත්‍ර ගාස්තු | 31,053.44 | 119,598.68 |
| ජාතිය ගොඩනැගීමේ බදු වියදම් | - | - |
| වෙනත් වියදම් | 1,539,072.50 | 1,093,351.53 |
| තැපැල් | 49,405.00 | 38,965.00 |
| ආරක්ෂක | 2,735,480.59 | 3,177,283.07 |
| මුද්දර ගාස්තු | 2,275.00 | 2,350.00 |
| දුරකථන | 4,627,324.28 | 4,443,562.71 |
| VAT වියදම් | - | - |
| ජලය | 141,427.78 | 142,784.07 |
| වාර්ෂික වාර්තාව 2017 | - | 142,751.50 |
| වාර්ෂික වාර්තාව 2015 | - | 1,860.00 |
| වාර්ෂික වාර්තාව 2016 | - | 128,365.00 |
| වාර්ෂික වාර්තාව 2018 | 34,067.00 | 489,660.00 |
| වාර්ෂික වාර්තාව 2019 | 8,626.50 | 598,154.16 |
| වාර්ෂික වාර්තාව 2020 | 115,296.00 | 8,198.00 |
| වාර්ෂික වාර්තාව 2021 | 88,896.00 | |
| වාර්ෂික වාර්තාව 2022 | 40,500.00 | |
| බොල් ණය | (158,345.59) | 1,511,975.62 |
| | 14,554,971.08 | 19,251,255.61 |

(16)

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

මූල්‍ය ප්‍රකාශන සඳහා උපලේඛණය - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස )

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **(08) ව්‍යාපෘති වියදම්** | | |
| පාඨමාලා/ ව්‍යාපෘති | 22,036,444.97 | 13,959,795.55 |
| | 22,036,444.97 | 13,959,795.55 |
| **(09) පර්යේෂණ හා සංවර්ධන වියදම්** | | |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 2,459,757.18 | 22,051,563.95 |
| උපදේශන ගාස්තු | - | 18,000.00 |
| | 2,459,757.18 | 22,069,563.95 |
| **(10) වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| සාමාජික ගාස්තු | 147,809.54 | 130,954.06 |
| වෘත්තීය ගාස්තු | - | - |
| කාර්ය මණ්ඩල පුහුණු | 24,000.00 | 203,000.00 |
| | 171,809.54 | 333,954.06 |

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස)**

| | 2022 | 2021 |
|---|---|---|
| **(11) මුදල් හා මුදලට සමාන දෑ** | රු. | රු. |
| **ජංගම ගිණුම්** | - | - |
| ලංකා බැංකුව | | |
| - A/c No 7054733 | 13,346,593.14 | 17,063,415.48 |
| - A/c No 307144 | (1,696,318.97) | 96,788.88 |
| - A/c No 307399 (අධ්‍යක්ෂවරයාගේ අරමුදල ) | (3,133.54) | 1,866.46 |
| - A/c No2479737 (වක්‍රීය අරමුදල ) | 2,339,389.26 | 1,615,848.40 |
| මහජන බැංකුව | | |
| - A/c No 313-1-001-9-0012847 | 678,804.83 | 678,804.83 |
| කොමර්ෂල් බැංකුව පීඑල්සී | | |
| -A/c No 1114029211 | 27,150.00 | 26,500.00 |
| ඉතිරිකිරීමේ ගිණුම් | - | - |
| ලංකා බැංකුව | | |
| -A/c No 326764 (FINDS) | 132,954.00 | 129,029.57 |
| -A/c No 328391 (NASDA) | 7,323.72 | 7,132.54 |
| අග්‍රිමය | | |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ගමන් වියදම් | - | 3,000.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අග්‍රිමය | - | 12,000.00 |
| මුදල් ප්‍රකාශ ප්‍රකාශනයේ කාර්ය සඳහා මුදල් හා මුදලට සමාන දෑ | 14,832,762.44 | 19,634,386.16 |
| | | |
| **(12) ආයෝජන** | | |
| අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම - ව්‍යාපෘති / පාඨමාලා අරමුදල | 12,432,041.03 | 11,285,897.37 |
| අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම - වක්‍රීය අරමුදල | 2,524,473.97 | 2,225,066.61 |
| අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම - FINDS ප්‍රදාන | 9,140,282.47 | 8,471,067.66 |
| ස්ථාවර තැන්පතු 01(76387182)- වක්‍රීය අරමුදල | 821,893.83 | 742,032.49 |
| ස්ථාවර තැන්පතු 02(76387290)-වක්‍රීය අරමුදල | 821,893.83 | 742,032.49 |
| ස්ථාවර තැන්පතු 03(76387299)- වක්‍රීය අරමුදල | 821,893.83 | 742,032.49 |
| ස්ථාවර තැන්පතු 04(76387310)- වක්‍රීය අරමුදල | 821,893.83 | 742,032.49 |
| ස්ථාවර තැන්පතු 05(76387322)- වක්‍රීය අරමුදල | 821,893.83 | 742,032.49 |
| ස්ථාවර තැන්පතු 06(76387328)- වක්‍රීය අරමුදල | 821,893.83 | 742,032.49 |
| ස්ථාවර තැන්පතු 07(76387343)- වක්‍රීය අරමුදල | 821,893.83 | 742,032.49 |
| ස්ථාවර තැන්පතු 25(81820199)-අධ්‍යක්ෂ මණ්ඩල අරමුදල | 34,161.20 | 32,380.28 |
| ස්ථාවර තැන්පතු 08(81819773) -ව්‍යාපෘති අරමුදල | 7,442,312.79 | 7,054,324.92 |
| ස්ථාවර තැන්පතු 09(81819900) - ව්‍යාපෘති අරමුදල (මාස 6) | 763,671.98 | 692,261.42 |
| ස්ථාවර තැන්පතු 10(81819988) - ව්‍යාපෘති අරමුදල (මාස 6) | 763,671.98 | 692,261.42 |
| ස්ථාවර තැන්පතු 11(81820008) ව්‍යාපෘති අරමුදල (මාස 6) | 763,671.98 | 692,261.42 |
| ස්ථාවර තැන්පතු 12(81820127) - ව්‍යාපෘති අරමුදල (මාස 6) | 763,671.98 | 692,261.42 |
| ස්ථාවර තැන්පතු 13(81820031) - ව්‍යාපෘති අරමුදල (මාස 3) | 748,886.22 | 678,567.35 |
| ස්ථාවර තැන්පතු 14(81820049) - ව්‍යාපෘති අරමුදල (මාස 3) | 748,886.14 | 678,567.27 |
| ස්ථාවර තැන්පතු 15(81820073) - ව්‍යාපෘති අරමුදල (මාස 1) | 702,625.26 | 630,334.92 |
| ස්ථාවර තැන්පතු 16 (81820087) වක්‍රීය අරමුදල (මාස 1) | 702,625.26 | 630,334.92 |
| ස්ථාවර තැන්පතු 17 (81820099) - වක්‍රීය අරමුදල (මාස 1) | 702,625.26 | 630,334.92 |
| ස්ථාවර තැන්පතු 19 (81820136) - වක්‍රීය අරමුදල (මාස 1) | 702,625.26 | 630,334.92 |
| ස්ථාවර තැන්පතු 20 (81820174) - වක්‍රීය අරමුදල (මාස 1) | 702,625.26 | 630,334.92 |
| ස්ථාවර තැන්පතු 21 (81820186) - වක්‍රීය අරමුදල (මාස 1) | 702,625.26 | 630,334.92 |
| **c/f** | 46,094,740.11 | 42,171,154.09 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 18වන පිටුවට ගෙනයන ලදී.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස )

| | | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **(12) ආයෝජන (ඉතිරි කොටස)** | | | |
| **b/f** | | 46,094,740.11 | 42,171,154.09 |
| ස්ථාවර තැන්පතු 22 (81820244) - චක්‍රීය අරමුදල(මාස 1) | | 702,625.26 | 630,334.92 |
| ස්ථාවර තැන්පතු 23 (81820190) - චක්‍රීය අරමුදල(මාස 6) | | 763,671.97 | 692,261.42 |
| ස්ථාවර තැන්පතු 24 (81820194) - චක්‍රීය අරමුදල(මාස 6) | | 610,937.57 | 553,809.13 |
| ස්ථාවර තැන්පතු 26(81820180) - ව්‍යාපෘති අරමුදල (මාස 1) | | 702,625.27 | 630,334.93 |
| ස්ථාවර තැන්පතු -83214406 (DF) | | 1,727,151.16 | 1,637,110.11 |
| ස්ථාවර තැන්පතු 27(83203809) චක්‍රීය අරමුදල | | 1,002,390.43 | 954,657.55 |
| ස්ථාවර තැන්පතු 28(87799992) චක්‍රීය අරමුදල | | 706,513.88 | 633,823.45 |
| අරමුදල් කලමනාකරණ ගිණුම (82097803) | | 48,759,835.53 | 32,242,661.35 |
| | | 101,070,491.18 | 80,146,146.95 |

ඉහත ආයෝජන කෙටි කාලසීමාවක් සඳහා වන අතර එක් වසරකට වැඩි කාලයක් අඛණ්ඩව පවතී.
එමනිසා එය මුදල් හා මුදලට සමාන දෑ ලෙස වර්ගීකරණය කර නැත.

| | | 2022 | 2021 |
|---|---|---|---|
| **(13) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | | |
| කාර්ය මණ්ඩල ණයකරු - TG | (උපලේඛණය 02) | 302.00 | 302.00 |
| ණයකරු - ඩබ්.ඩී.වාමික මයා | | 2,663,925.87 | |
| රක්ෂණ සංස්ථා ණයකරු | | 9,700.00 | 9,700.00 |
| ලැබිය යුතු ගිණුම් - TG | (උපලේඛණය 02) | 3,282,141.28 | 3,229,297.35 |
| ලැබිය යුතු ගිණුම් - P/C | (උපලේඛණය 02) | 4,941,772.13 | 4,570,600.73 |
| ණයකරු - පී.ටී.ප්‍රනාන්දු මයා | | 4,000.00 | 4,000.00 |
| ලැබිය යුතු ගිණුම් PF | (උපලේඛණය 02) | 1,001,640.75 | 323,940.13 |
| ලැබිය යුතු ගිණුම් RF | (උපලේඛණය 02) | 150,414.45 | 52,826.17 |
| ලැබිය යුතු ගිණුම් - FINDS | (උපලේඛණය 02) | 342,571.87 | 102,674.05 |
| ණයකරු - ජයතු ප්‍රනාන්දු මයා | | 106,894.72 | 106,894.72 |
| ණයකරු - බී.ආර්.පී.පෙරේරා මයා | | 39,699.66 | 39,699.66 |
| ණයකරු - පී.පී.කේ.රොද්‍රිගු | | 15,652.69 | 15,652.69 |
| වෙනත් තැන්පතු | | 155,315.00 | 155,315.00 |
| ආර්.එස්.ණයකරු | | 14,434.91 | 14,434.91 |
| මැතිවරණ දෙපාර්තමේන්තුව | | 8,159.60 | 8,159.60 |
| අමාත්‍යාංශ ණයකරු Dish T.V.පැකේජය | | 33,381.50 | 33,381.50 |
| උත්සව අත්තිකාරම් | (උපලේඛණය 03) | 37,500.00 | 13,750.00 |
| TG පාලන | | 1,755,824.86 | 3,450,474.49 |
| ණයකරු - එල්.වී.විජේසිංහ | | 627.00 | 627.00 |
| ණයකරු - පී.ඩී.ටී ද සිල්වා | | 9,711.80 | 9,711.80 |
| ණයකරු - වයි සාගරගේ | | 3,750.00 | 3,750.00 |
| බැංකු ඇපකර | | - | 600,000.00 |
| | | 14,577,420.09 | 12,745,191.80 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 19 වන පිටුවට ගෙනයන ලදී.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස )**

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **(13.1) සිදු කෙරෙන කාර්යයන් - ව්‍යාපෘති** | | |
| SCADA ව්‍යාපෘතිය | 49,159.00 | 48,489.00 |
| අකුණු වලින් අරක්ෂාවීමේ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම (ECLP) | - | 148,750.96 |
| PDM II ව්‍යාපෘතිය 2021 (Elec Div ) | 67,111.79 | 67,111.79 |
| SOILRE ව්‍යාපෘතිය (Elec Div) | - | - |
| THD ව්‍යාපෘතිය 2021 (ISD Div ) | 34,228.37 | 29,728.37 |
| STHTRI ව්‍යාපෘතිය (com Div ) | 507,851.53 | 133,494.53 |
| IRR Matara ව්‍යාපෘතිය (Com Div) | 321,065.96 | 304,985.96 |
| NASTEM ව්‍යාපෘතිය (com Div ) | 581,021.84 | 516,820.44 |
| PT POC ව්‍යාපෘතිය (Elec) | 269,967.18 | 244,967.18 |
| DT BAT ව්‍යාපෘතිය (Elec Div ) | 25,216.45 | 18,328.45 |
| කැලිස්ටෝ රේඩියෝ වර්ණාවලීමාන ව්‍යාපෘතිය | - | 92,772.52 |
| Clsf project of BPU (IT Div) | 7,000.00 | - |
| LCNMV ව්‍යාපෘතිය (Comm Div) | 50,771.18 | - |
| MQFD ව්‍යාපෘතිය 2022 (SAD) | 3,330.00 | - |
| GMEDN ව්‍යාපෘතිය 2022(SAD) | 4,000.00 | - |
| AT ව්‍යාපෘතිය 2022 (ELEC) | 5,488.04 | - |
| AVBH ව්‍යාපෘතිය 2022 (Com Div) | 798,937.00 | - |
| S12S10 ව්‍යාපෘතිය 2022(Com) | 2,474,514.00 | - |
| RM9SLR ව්‍යාපෘතිය 2022(Com) | 142,025.00 | - |
| TPM ව්‍යාපෘතිය 2022(Space Appli) | 9,260.00 | - |
| වෙබ් පාලන දුරදක්න ව්‍යාපෘතිය | 1,099.58 | - |
| ස්වයංක්‍රීය වාරිමාර්ග පද්ධති (ELE) | - | - |
| ECGTA ව්‍යාපෘතිය (Elec Div) | - | - |
| | 5,352,046.92 | 1,605,449.20 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 20 වන පිටුවට ගෙනයන ලදී.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස )**

| | | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **(13.2) සිදු කෙරෙන කාර්යයන් - පාඨමාලා** | | | |
| PEC 27 2020 (සන්නිවේදන අංශය) | | | 347,587.85 |
| PLC SLR ව්‍යාපෘතිය 2022 (සන්නිවේදන අංශය) | | 317,462.00 | |
| **(13.3) කාර්ය මණ්ඩල ණය** | | | |
| ආපදා ණය | (උපලේඛණය 04) | 13,122,338.00 | 12,677,562.00 |
| මෝටර් සයිකල් ණය | (උපලේඛණය 05) | 523,669.00 | 578,399.00 |
| මෝටර් රථ ණය | (උපලේඛණය 06) | 3,509,669.00 | 2,993,740.00 |
| ගංවතුර සහන ණය | (උපලේඛණය 06) | - | - |
| | | 17,155,676.00 | 16,249,701.00 |
| එක් වසරකට පසු ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | | (9,672,890.00) | (9,042,870.00) |
| එක් වසරක් තුල ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | | **7,482,786.00** | **7,206,831.00** |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | | 27,729,715.01 | 21,905,059.85 |
| අඩුකළා : | | | |
| බොල්ණය සඳහා ප්‍රතිපාදන | | (5,614,682.84) | (5,773,028.43) |
| | | **22,115,032.17** | **16,132,031.42** |
| **(14) භාණ්ඩ වට්ටෝරු** | | | |
| ඉලෙක්ට්‍රොනික උපාංග | | 3,580,707.28 | 3,608,547.36 |
| ලිපිද්‍රව්‍ය | | 1,788,835.75 | 1,790,473.17 |
| වෙනත් | | 11,276.48 | 23,633.73 |
| විද්‍යුත් හා යාන්ත්‍රික | | 166,154.90 | 184,773.55 |
| සුභසාධක | | 137,635.50 | 72,723.00 |
| උපාංග -TG | | 199,218.03 | 199,218.03 |
| භාණ්ඩ වට්ටෝරු අයිතම - TG | | 518,035.98 | 518,035.98 |
| භාණ්ඩ වට්ටෝරු අයිතම - ව්‍යාපෘති (P/C) | | 2,000,013.92 | 2,000,013.92 |
| මෙවලම් - TG | | 1,392,996.69 | 1,392,996.69 |
| | | **9,794,874.53** | **9,790,415.43** |
| (15) පූර්ව ගෙවීම් | | | |
| අත්තිකාරම් ගෙවීම් - TG | (උපලේඛණය 07) | 3,744,338.05 | 324,462.01 |
| අත්තිකාරම් ගෙවීම් - PC | | - | 15,000.00 |
| මුද්දර අග්‍රිමය | | 21,362.00 | 36,077.00 |
| SDB-ව්‍යාපෘතිය | | - | - |
| SDB-උපකරණ | | | |
| | | **3,765,700.05** | **375,539.01** |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 21 වන පිටුවට ගෙනයන ලදී.

# නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස)

**(16) දේපල, පිරියත හා උපකරණ**

| | 2022 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (අපහරණයන්) / ගැලපීම් | 2022 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | |
| සින්නක්කර වත්කම් | | | | |
| ගොඩනැගිලි | 182,714,758.01 | | (1,116,234.11) | 181,598,523.90 |
| චන්ද්‍රිකා ඇන්ටනා | 2,959,797.83 | | | 2,959,797.83 |
| පරිගණක | 78,248,061.26 | 540,864.40 | | 78,788,925.66 |
| විද්‍යාගාර උපකරණ | 256,250,727.85 | 3,691,285.27 | | 259,942,013.12 |
| කාර්යාල උපකරණ | 40,965,150.58 | 710,951.40 | | 41,676,101.98 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 20,155,386.71 | 22,526.00 | | 20,177,912.71 |
| මෝටර් රථ | 28,785,689.00 | | | 28,785,689.00 |
| පුස්තකාල පොත් | 24,573,965.97 | 18,350.00 | | 24,592,315.97 |
| | 634,653,537.21 | 4,983,977.07 | (1,116,234.11) | 638,521,280.17 |
| **සමුච්චිත ක්ෂය කිරීම** | | | | |
| **සින්නක්කර වත්කම්** | | | | |
| ගොඩනැගිලි | 78,843,584.47 | 9,135,737.90 | (502,305.34) | 87,477,017.03 |
| චන්ද්‍රිකා ඇන්ටනා | 2,959,778.83 | - | | 2,959,778.83 |
| පරිගණක | 63,306,869.44 | 4,794,057.48 | | 68,100,926.92 |
| විද්‍යාගාර උපකරණ | 178,781,749.72 | 14,795,647.10 | | 193,577,396.82 |
| කාර්යාල උපකරණ | 26,447,797.48 | 2,614,961.17 | | 29,062,758.65 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 13,974,047.89 | 1,442,735.83 | | 15,416,783.72 |
| මෝටර් රථ | 28,545,229.47 | 65,440.00 | | 28,610,669.47 |
| පුස්තකාල පොත් | 24,135,282.31 | 129,875.54 | | 24,265,157.85 |
| | 416,994,339.61 | 32,978,455.02 | (502,305.34) | 449,470,489.29 |
| **ඉදිරියට ගෙන ආ අගය** | 217,659,197.60 | | | **189,050,790.88** |

සටහන : ගොඩනැගිලි දෙපාතර්මේන්තුව වෙත ආපසු භාරදීමක් හේතුවෙන් වටිනාකම අගය සඳහා ප්‍රත්‍යාවර්ත ගැලපීමක් සිදුකර ඇත

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 22 වන පිටුවට ගෙනයන ලදී.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස )

| | | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **(17) සිදු කෙරෙමින් පවතින කාර්යයන් - ඉදිකිරීම්** | | | |
| WIP - ගෘහභාණ්ඩ හා සවිකිරීම් (කෑම කාමරය) | | - | - |
| WIP ගොඩනැගිල්ල - මායිම් ලකුණු කිරීම හා ආරක්ෂාව (පිටිපන) | | 3,545,744.40 | 3,545,744.40 |
| | | 3,545,744.40 | 3,545,744.40 |
| **(18) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | | |
| ගෙවිය යුතු ගිණුම් -TG | (උපලේඛණය 08) | 1,106,435.10 | 284,717.10 |
| ගෙවිය යුතු ගිණුම් -PC | (උපලේඛණය 08) | 113,268.87 | 71,190.00 |
| වැටුප් හා වේතන පාලනය | | - | - |
| E.P.F. පාලන | | 1,512,877.84 | 1,725,956.65 |
| E.T.F.පාලන | | 181,545.34 | 207,114.80 |
| ණය හිමි - මහ භාණ්ඩාගාරය | | 1,443,680.69 | 1,391,884.00 |
| ආපසු ගෙවන තැන්පතු | | - | 87,600.00 |
| ලැබීම් මත ගෙවිය යුතු VAT P - P/C | | 38,219.71 | 38,219.71 |
| සුභසාධක සමිති පාලන | | 47,256.00 | 200.00 |
| ගෙවිය යුතු NBT - TG | | | |
| ගෙවිය යුතු NBT - P/C | | 6,080.00 | 6,080.00 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු - TG | | 7,625.00 | 9,425.00 |
| ගෙවිය යුතු උපයනවිට ගෙවීම් බදු (Payee tax) - TG | | 13,543.00 | 11,943.00 |
| උපයෝජන පාලනය | | 5,192,470.87 | 3,088,216.57 |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තු ණයහිමි | | - | 984,403.00 |
| ආපිකෝ ඉන්ටීරියර්ස් -ණයහිමි | | 14,377.61 | 14,377.61 |
| PC පාලන | | 1,755,824.86 | 3,450,474.49 |
| රඳවාගැනීම් | | 1,211,358.55 | 1,339,624.66 |
| ණයහිමි- ඩබ් ඩී වාමික | | - | 8,535.13 |
| ණයහිමි - එච් විජේසූරිය | | 24,564.33 | 25,827.02 |
| වෘත්තීය සමිති පාලනය | | - | 100.00 |
| | | 12,669,127.77 | 12,745,888.74 |
| **(19) සමුච්චිත වියදම්** | | | |
| භාණ්ඩාගාර අරමුදල් | (උපලේඛණය 09) | 4,207,677.75 | 3,504,062.40 |
| ව්‍යාපෘති / පාඨමාලා | (උපලේඛණය 09) | 594,193.00 | 264,778.00 |
| | | 4,801,870.75 | 3,768,840.40 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 23 වන පිටුවට ගෙනයන ලදී.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස)**

| | | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **(20) විශ්‍රාම ප්‍රතිලාභ වගකීම** | | | |
| වසර ආරම්භයේ ඇති ශේෂය | | 52,835,090.05 | 49,678,539.54 |
| එකතුකළා : | | | |
| වසර සඳහා ප්‍රතිපාදන | | 3,019,646.08 | 4,150,710.51 |
| | | 55,854,736.13 | 53,829,250.05 |
| අඩුකලා : | | | |
| වසරතුළ සිදුකළ ගෙවීම් | | (4,483,522.50) | (994,160.00) |
| වසර අවසානයේ ශේෂය | (උපලේඛණය10) | 51,371,213.63 | 52,835,090.05 |
| 20(අ)(ආ) | | | |
| (අ) එක් වසරක් තුළ | | 2,715,812.50 | 2,761,555.00 |
| (ආ) එක් වසරකින් පසු | | 48,655,401.13 | 50,073,535.05 |
| **විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා උපකල්පන** | | | |
| වට්ටම් අනුපාතය | | 6.50% | 6.50% |
| වැටුප් වර්ධක | | 8.00% | 8.00% |
| කායර් මණ්ඩල පිරිවැටුම් | | 8.93% | 7.03% |
| විශ්‍රාම යන වයස | | වසර 60 | වසර 62 |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| **(21) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන** | | | |
| ආරම්භයේ ඇති ශේෂය | | 308,895,834.85 | 353,668,028.23 |
| කාලසීමාව තුළ ලැබූ ප්‍රදානයන් | | 2,295,000.00 | 11,740,000.00 |
| ගැලපීම් | | - | - |
| ධාරිතා වර්ධන වැඩසටහන් | | (2,459,757.18) | (22,051,563.95) |
| ක්‍රමක්ෂය | | (32,445,140.97) | (34,460,629.43) |
| වසර අවසානයේ ශේෂය | | 276,285,936.70 | 308,895,834.85 |
| **මුදල් නොවන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන** | | | |
| වසර ආරම්භයේ ඇති ශේෂය | | - | 133,052.05 |
| කාලසීමාව තුළ ලැබූ ප්‍රදානයන් | | | |
| ක්‍රමක්ෂය | | - | (133,052.05) |
| වසර අවසානයේ ශේෂය | | - | - |
| අමාත්‍යාංශයේ ප්‍රාග්ධන ප්‍රදාන | | 13,156,751.40 | 13,156,751.40 |
| | | 13,156,751.40 | 13,156,751.40 |
| **ප්‍රාග්ධන ප්‍රදාන** | | 289,442,688.10 | 322,052,586.25 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 24 වන පිටුවට ගෙනයන ලදී.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස)**

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **(22) සංචිත** | | |
| පොදු සංචිතය | 272,721.64 | 272,721.64 |
| සෙල්ටෙල් පරිත්‍යාග | 213,333.34 | 213,333.34 |
| පයේෂණ හා උපදේශන අරමුදල | 1,341,446.90 | 1,341,446.90 |
| විදේශ ප්‍රදාන | 3,464,295.25 | 3,464,295.25 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 26,682,504.54 | 26,682,504.54 |
| | 31,974,301.67 | 31,974,301.67 |
| **පයේෂණ සංචිතය** | | |
| ආරම්භයේ ඇති ශේෂය | 201,261.29 | 205,583.83 |
| ලැබීම් | 33,528.65 | - |
| ගැලපීම් | | (4,322.54) |
| වියදම් | | |
| | 234,789.94 | 201,261.29 |
| | 32,209,091.61 | 32,175,562.96 |
| **වෙනත් ප්‍රදාන හා පරිත්‍යාග** | | |
| ආරම්භයේ ඇති ශේෂය | 22,763,605.95 | 23,066,377.26 |
| ලැබූ ස්ථාවර වත්කම් | - | - |
| ගැලපීම් | | |
| ක්‍රමක්ෂය | (31,008.71) | (302,771.31) |
| | 22,732,597.24 | 22,763,605.95 |
| **ප්‍රත්‍යාගණන අරමුදල** | | |
| ආරම්භයේ ඇති ශේෂය | 15,694,103.98 | 14,657,416.69 |
| ලැබීම් | 723,540.86 | 429,251.12 |
| ගැලපීම් | - | - |
| පොලී ආදායම | 1,633,829.60 | 607,436.17 |
| වියදම් | | |
| | 18,051,474.44 | 15,694,103.98 |
| **අධ්‍යක්ෂවරයාගේ අරමුදල** | | |
| ආරම්භයේ ඇති ශේෂය | 1,699,436.38 | 1,611,253.26 |
| පොලී ආදායම | 122,571.90 | 88,183.12 |
| ගැලපීම් | - | - |
| වියදම් | | |
| | 1,822,008.28 | 1,699,436.38 |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 25 වන පිටුවට ගෙනයන ලදී.

## නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට (ඉතිරි කොටස)**

| | 2022 | 2021 |
|---|---|---|
| | රු. | රු. |
| **FINDS ප්‍රදාන** | | |
| ආරම්භයේ ඇති ශේෂය | 8,681,350.90 | 8,255,183.14 |
| පොලී ආදායම | 913,037.06 | 426,167.76 |
| වියදම් | | |
| | 9,594,387.96 | 8,681,350.90 |
| **NASDA ප්‍රදාන** | | |
| ආරම්භයේ ඇති ශේෂය | 7,132.52 | 7,217.24 |
| ගැලපීම් | | |
| පොලී ආදායම | 216.18 | 215.28 |
| වියදම් | (25.00) | (300.00) |
| | 7,323.70 | 7,132.52 |
| | 84,416,883.23 | 81,021,192.69 |
| **(23)සමුච්චිත අතිරික්තය / (හිඟය )** | | |
| ආරම්භක ශේෂය -TG | (177,115,796.22) | (175,995,778.33) |
| ආරම්භක ශේෂය - P/C | 58,993,815.50 | 51,749,362.54 |
| ගැලපීම් - TG | - | 509,729.28 |
| ගැලපීම් - PC | (316,380.76) | 265,219.03 |
| වියදම් මත අමතර ආදායම | 25,919,175.09 | 5,349,486.76 |
| | (92,519,186.39) | (118,121,980.72) |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | 281,340,384.94 | 284,951,798.22 |

# 10.0 පසුගිය දස වසර තුළ ආයතනය ලද මූල්‍ය ජයග්‍රහණයන්

- පසුගිය පස් වසරක කාලය තුළ 2018) සිට 2022 දක්වා (ආයතනය විසින් උපයන ලද ආදායම % 167කින් වැඩි වී ඇත .

- ආයතනය විසින් උපයන ලද වැඩිම ආදායම 2022 වසරේ දී වාර්තා විය .එම අගය රු .මිලි 47 . කි .
- ජාත්‍යන්තර තාක්ෂණික සහයෝගීතාවන් තුළින් උපායමාර්ගිකව සාකච්ඡාකර එළඹගත් හවුල්කාරීත්වයන් මගින් ආයතනය විසින් සිදුකරන ලද නැනෝ චන්ද්‍රිකා ව්‍යාපෘතියේ සමස්ත වටිනාකම ආසන්න වශයෙන් රු .බිලියන1 ක් වේ) .ඉහත සඳහන් ආකාරයේ උපායමාර්ගික සහයෝගිතාවන් නොමැතිව ,මෙරට අරමුදල් භාවිතාකර මෙම ව්‍යාපෘතිය සිදුකරන ලද්දේ නම් දරනු ලැබිය යුතු වියදම් සළකා පිරිවැය මනිනු ලැබුවේ නම්)

# 11.0 සැලසුම් කරන ලද කෙටි හා මධ්‍යකාලීන ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය

- **මූලික අභ්‍යවකාශ තාක්ෂණයන්හි ජාතික හැකියාවන් ලබාගැනීම හා වැඩිදියුණු කිරීම -**

  - ජපානයේ කියුෂු තාක්ෂණ ආයතනය (Kyutech) සමග සහයෝගීතාවයෙන් නැනෝ චන්ද්‍රිකා නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීමේ කාර්යය තවදුරටත් සිදු කිරීමට අභ්‍යවකාශ තාක්ෂණ ජාතික හැකියාවන් ලබාගැනීම සඳහා අභ්‍යවකාශ තාක්ෂණ හැකියාවන් සහිත රටවල් සමග සහයෝගීතාවන් හරහා අභ්‍යවකාශ තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික හැකියාවන් ලබාගැනීම.

  - ඉදිරියේදී පියාසර මොඩලයක් දක්වා වැඩිදියුණු කර සනක චන්ද්‍රිකාවක ඉංජිනේරු මොඩලයක් ගොඩ නැගීම වැඩිදියුණු කිරීම ( ISS කක්ෂයේ කක්ෂගත කිරීම සඳහා)

- **ශ්‍රී ලංකාවේ ගගනවිද්‍යා නිර්මාණ හා නිෂ්පාදන හැකියාවන් වැඩිදියුණු කිරීම** –
  ස්ථායීතාවය සහ පාලනය කිරීමේ හැකියාව වැඩිදියුණු කරමින්, විවිධ යෙදවුම් සඳහා සුදුසු ව්‍යුහයන් සහිතව අචල තටු **UAVs (Unmanned Aerial Vehicles)** හා භ්‍රමණ තටු හතරකින්/ භ්‍රමණතටු හයකින් යුත් කොප්ටර් තාක්ෂණය නිර්මාණය කිරීම.

  2023-2024 වර්ෂ වලදී, කෘෂිකාර්මික යෙදවුම් සඳහා සිතියම්ගත කිරීම සහ ද්‍රව්‍ය ඉසින UAV නිර්මාණය කොට ගොඩනැගීම සහ සාම්ප්‍රදායිනුකූල නොවන UAV පද්ධතියක් නිර්මාණයට අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා සැලසුම් කර ඇත.

- **ශ්‍රී ලංකාවේ මැකාට්‍රොනික් හා රොබොටික් හැකියාවන් වැඩිදියුණු කිරීම -** කර්මාන්ත සඳහා සුදුසු පාරිභෝගික අවශ්‍යතාවන්ට ගැලපෙන මැකාට්‍රොනික් හා රොබොටික් යෙදවුම් වැඩිදියුණු කිරීම.තේ කර්මාන්තය සඳහා යාන්ත්‍රීකරණය කරන ලද වරණය කරන ලද තේ දළු නෙලීමේ යන්ත්‍රයක් වැඩිදියුණු කිරීම සැලසුම් කරන ලද එක් විශේෂිත ක්‍රියාකාරකමක් වේ.

- **දුරස්ථ සංවේදන හා භූගෝලීය තොරතුරු පද්ධති (RS/ GIS) සම්බන්ද ක්‍රියාකාරකම් -**

කෘෂිකර්මාන්තය, වැව්ලි, පාරිසරික, ස්වභාවික සම්පත් කළමනාකරණය ආදී ක්ෂේත්‍රයන්හි යෙදවුම් සඳහා පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා ඡායාරූප හා අහසේ සිට (UAV) ගනු ලබන ඡායාරූප භාවිතයෙන්ව්‍යාපෘති තව දුරටත් ක්‍රියාත්මක කිරීම. 2023-24 සඳහා විශේෂයෙන් හඳුනාගත් ව්‍යාපෘති වන්නේ“වන භායනය අධීක්ෂණය කිරීම සහ ප්‍රමාණනය”, “තේ වගාවන් සිතියම්ගත කිරීම් හා අධීක්ෂණය”,“විදුලිය බෙදාහැරීමේ ජාලය සකස් කිරීම” හා “විභව්‍ය මසුන් ඇල්ලීමේ කලාප පුරෝකථනය කිරීම”යි.

- ඉලෙක්ට්‍රොනික, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික හා සන්නිවේදන ව්‍යාපෘති – ඉහළ සමාජ ආර්ථික බලපෑමක් සහිත කාර්මික විසඳුම් හා ඉලෙක්ට්‍රොනික උපකරණ/පද්ධති නිර්මාණය කොට ගොඩනැගීම.

- අතිනවීන ඉලෙක්ට්‍රොනික පද්ධති, මැනුම් උපකරණ හා වෛද්‍ය උපකරණයන්හි දෝෂ හඳුනා ගැනීම හා දෘඪකාංග පිළිසකර කිරීම්. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක දුම්රිය එන්ජින් හා දුම්රිය වල ක්ෂුද්‍ර-සකසනය මත පදනම්වූ දෝෂ යථා තත්වයට පත්කිරීම සැලසුම් කරන ලද විශේෂ කාර්යයක්වේ.

- අකුණු ආරක්ෂණ පද්ධති, විදුලිබල සැපයුම් වල තත්වය සහ භූගෝලීය තොරතුරු පද්ධති/ දුරස්ථ සංවේදනය (GIS/RS) පිළිබඳ උපදේශනයන්

- ඉලෙක්ට්‍රොනික, සන්නිවේදන, රොබොටික්, තොරතුරු තාක්ෂණ හා දුරස්ථ සංවේදන/GIS ක්ෂේත්‍රයන්හි අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්.

- ප්‍රායෝගික ඉලෙක්ට්‍රොනික විද්‍යාව, පරිසණක දෘඪකාංග සහ පරිගණක වල දෝෂ පිළිසකර කිරීම පිළිබඳ මූලික සහ මධ්‍යම මට්ටමේ පුහුණු වැඩසටහන්

- තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති හා තාරකා විද්‍යාව ජනප්‍රිය කිරීමේ ක්‍රියාකාරකම්

- කාර්යසාධනය පරීක්ෂා කිරීම්/ සහතිකකරණය, ක්‍රමාංකනය.

- විශේෂ කෙටිකාලීන පුහුණු, පශ්චාත් උපාධි පුහුණු, විශේෂඥ දූත මෙහෙයන් හා වෙනත් ඒ හා සම්බන්ධ කාර්යයන් යොදා ගනිමින් ගගනවිද්‍යා තාක්ෂණ, අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්, රොබොටික්ස් සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු විෂය ක්ෂේත්‍ර වල,ආයතනික මානව සම්පත් ධාරිතාව සංවර්ධනය කිරීම.

# 12.0 2022 වසර සඳහා විගණන කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටුව මඟින් ගිණුම්කරන ප්‍රතිපත්ති, ඒවායේ භාවිතයන්, අවධානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන පිලිවෙත් තක්සේරු කිරීම හා විධිමත් කිරීම වැනි කාර්යයන් ඉටුකරනු ලබයි.

**කමිටුවේ කාර්ය භාරය**

විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය වන්නේ, විගණන නිරීක්ෂණ වලින් මතුවන කරුණු පිළිබඳව සොයාබැලීම, නිර්දේශ ලබා දීම, මූල්‍ය වාර්තා විධිමත් ලෙස සකස් කර ඇති බව සහතික කිරීම, ආයතනයේ අභ්‍යන්තර හා බාහිර විගණන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම, ඒ පිළිබඳ නිර්දේශ ලබා දීම, නෛතික හා නියාමන අවශ්‍යතා පරිදි කටයුතු කරන බව සහතික කිරීම ආදිය වේ.

**කමිටුවේ සංයුතිය**

කමිටුව භාණ්ඩාගාර නියෝජිතවරයාගේ සභාපතිත්වය යටතේ විධායක නොවන පාලක මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විතවේ. 2022 වසරේදී එහි සංයුතිය පහත දක්වා ඇත.

- එස්.යූ. චන්ද්‍රකුමාරන් මහතා (සභාපති/ පාලක මණ්ඩල සාමාජික/ භාණ්ඩාගාර නියෝජිත/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව)
- මහාචාර්ය කේ.ඩබ්. ජයවර්ධන මහතා - පාලක මණ්ඩල සමාජික
- මෙරික් ගුණරත්න මහතා - පාලක මණ්ඩල සමාජික
- එස්. කාරියවසම් මහතා - විගණන අධිකාරී/ කමිටු නිරීක්ෂක - ජාතික විගණන කාර්යාලය

**කමිටු රැස්වීම්**

එතෙක් කටයුතු කල භාණ්ඩාගාර නියෝජිතවරයාගේ සේවා කාලය අවසන් වූ බැවින් නව නියෝජිතයෙකු පත් නොවූ බැවින් පලමු මාස 6 තුල අදාළ කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි වූ අතර 2022 වසර තුළ ඔක්තෝබර් 11 දින සහ දෙසැම්බර් 29 දින කමිටු රැස්වීම් පවත්වනු ලැබීය.

**2022 වසරේදී සිදුකළ ක්‍රියාකාරකම්හි සාරාංශය**

- ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව, ඵලදායි මූල්‍ය වර්තාකරන ක්‍රමවේදයක් ඇති බව සහතික කිරීම සඳහා ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ මෙහෙයුම් සහ සඵලතාව සමාලෝචනය කිරීම.
- වාර්ෂික වාර්තා, ක්‍රියාකාරි සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම, කාර්තුමය කාර්යසාධන වාර්තා, ප්‍රගති වාර්තා ආදීය සමාලෝචනය කිරීම.

- අදහස් දැක්වීම්, නිරීක්ෂණ සහ නිර්දේශ මත පදනම්ව වාර්ෂික සමීක්ෂණ මණ්ඩල ක්‍රියා පටිපාටිය සමාලෝචනය කිරීම.
- විගණන විමසුම් සහ ආයතනය විසින් ලබාදුන් පිළිතුරු පිළිබඳව පසු විපරම් කිරීම.
- විගණන කරුණු නැවත සිදුවීම වැළැක්වීම සඳහා නිර්දේශ ලබාදීම.
- වත්මන් ආර්ථික තත්වය සළකා බලමින්, වියදම් ඉතිරි කිරීම සමාලෝචනය කිරීම සහ නිර්දේශ ලබාදීම. (බලශක්තිය, ජලය ආදිය සඳහා)

**නිගමනය**

ජාතික විගණන කාර්යාලය (විගණකාධිපති) විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සහ අභ්‍යන්තර විගණකවරයාගේ නිරීක්ෂණ පදනම්ව, කමිටුව විසින් ක්‍රියාමාර්ග ගත යුතු හෝ වැඩිදියුණු කිරීම් සිදුකිරීම අවශයයි සලකනු ලබන කරුණු හඳුනාගෙන අදාළ නිර්දේශ ලබා දී පාලක මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

# 13.0 2022 වසර සඳහා විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | අයිඑම්ටී/සී/ඒසීසීඅයිඑම්ටී/එෆ්ඒ/2022 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 මැයි 31 දින |

සභාපති,
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ආයතනය විසින් 2022 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භෞතික තොග සත්‍යාපන ශේෂය රු.4,508,103ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම රු.5,684,610ක් ලෙස දැක්වීමෙන් රු.1,176,506 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ආයතනයේ භාවිතයට ගනු ලබන උපකරණ වටිනාකම රු.1,392,996 ක් ස්ථාවර වත්කම් ලෙස හඳුනා නොගෙන තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා

තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත්වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති, රීති විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 134 (1) වගන්තිය | ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක) විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරෙහි 2020 මාර්තු 10 දින සිට වැඩ බැලීම සිදුකරනු ලබයි. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 2021/01 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශ අත්පොතෙහි 6.6 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් දින හැටක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, විගණිත දිනය වූ 2023 මැයි 10 දින වන විටත් එකී වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**3. වෙනත් කරුණු**

(අ) වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.5,735,439ක් වූ ලැබියයුතු ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේශණ හා කැණීම් කටයුතු සඳහා ඡායාරූප ලබාගැනීමේ අරමුණින් වටිනාකම රු.10,564,677 ක් වූ නියමුවන් රහිත යානයක් 2016 අගෝස්තු මාසයේදී මිලදී ගෙන තිබුණි. යානය මිලදී ගැනීමට පෙර එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රු.110,322 ක වියදමක් දරා නිලධාරීන් දෙදෙනෙකුට විදේශීය පුහුණුවක්ද ලබාදී තිබුණි. එසේ වුවද, මිලදී ගත් දින සිට විගණිත දිනය දක්වා අදාල කාර්යය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන ඉක්මවා ආයතනය විසින් එකග වී ඇති වියදම් රු.1,755,825 ක් ගෙවියයුතු වියදමක් හා එම වටිනාකමම භාණ්ඩාගාරයෙන් ලැබියයුතු ආදායමක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ව්‍යාපෘතිවල ස්වභාවය අනුව භාවිතයට ගැනීමේ අවශ්‍යතාවන් මත වර්ෂ 03 කට වැඩි කාලයක සිට පවත්වාගෙන එන රු.2,717,267 ක චලනය නොවන තොග වර්තමානය වන විටත් ආයතනයේ ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්. පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# 14.0. 2022 වසරේ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

**නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**2.2.2 නීති , රීති විධානයට යොමුව**

(අ) 2020.03.07 දිනෙන් පුරප්පාඩු වූ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර සඳහා පුරප්පාඩුව පුරවන තෙක්, ආයතනයේ මූල්‍ය අංශයේ රාජකාරී කටයුතු අකර්මන්‍ය නොවී පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය මත, HR/AD 2020.01.05 දිනැති පාලක මණ්ඩල අනුමැතිය මත, පුරප්පාඩු වූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) යන තනතුරෙහි රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා 2020.03.10 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) පත් කරන ලදී. 2021 වසරේ සිට රජය විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රතිපාදන මත සේවක බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති අතර, එම නිසා බඳවා ගැනීම් සිදු කිරීමට හැකියාවක් නොලැබුණු අතර ඉදිරියේදී එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් පිළියෙළ කොට ඇති අතර එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.
2023 වර්ෂයේ සිට වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**3. වෙනත් කරුණු**

(අ) විගණන නිරීක්ෂණයේ සඳහන් වසර 2කට වැඩි කාලයක් ලැබිය යුතු ශේෂයන් ලෙස දක්වා ඇති අගය රු.5,735,439.21 කි.එම මුදලින් 66%ක් නියෝජනය වන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිසමෙන් ලැබිය යුතු මුදල වන රු. 3,205,676.60ක අගයනි. එම මුදල ලබා ගැනීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.අනෙකුත් ඉන්වොයිසි සඳහා 2022 වර්ෂයේදී අවස්ථා 04 කදී සිහිකැදවීම් සිදුකර ඇති අතර අදාල සේවා සැපයූ තාක්ෂණික අංශ මගින් ද එම දැනුවත් කිරීම් සිදු කර ඇත.

එම ඉන්වොයිසියේ වටිනාකම් වලින් 60% රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු අගයන් වේ. ඒවා නම් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, දිවි නැගුම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදි රාජ්‍ය ආයතන වලින් අයවිය යුතු අගයන් වේ.

ඉතිරි ඉන්වොයිස් 2009, 2010,2011 වැනි වර්ෂ වල පෞද්ගලික අංශයට සිදු කල සේවාවන් වෙනුවෙන් අයවිය යුතු අගයන් වේ. ඒ පිළිබඳව විටින් විට සිහි කැදවීම් සිදුකරන ලදී. මේ වන විට එම සමාගම් දැනට ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින බැවින් ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ දුෂ්කරතා මතු වී ඇත.

(ආ) වර්ෂ 2016 අගෝස්තු මාසයේ දී, එක්සත් රාජධානියේ Questuav Ltd සමාගම මගින් නිෂ්පාදිත Q-200 AGRI PRO UAV යානය, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, නගර සැලසුම්කරණය, මිනුම් සහ සිතියම්කරණය, පුරාවිද්‍යා ආදී විවිධ ක්ෂේත්‍රවල සංවර්ධන ව්‍යාපෘති සඳහා භාවිතාවන මිල අධික අධි-විභේදනකින් (high resolution) යුත් චන්ද්‍රිකා ඡායාරූප සඳහා ආදේශකයක් ලෙස ඡායාරූප ලබා ගැනීම සඳහා, ආරක්ෂක අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද උපරිම පියාසර උස වන මීටර් 150 ක (අඩි 492) සීමාවට යටත්ව ආනයනය කරන ලදී.

ගුවන් යානය ආරක්ෂිතව පියාසර කිරීම සඳහා නිර්දේශිත අවම උස අඩි 400 (මීටර් 122) වුවත්, වර්ෂ 2016 සිට අප විසින්විටින් විට අවස්ථා ගණනාවකදී UAV යානය පියාසර කිරීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අවසර ඉල්ලූ විට UAV යානයේ උපරිම පියාසර උස මීටර් 60 ක (අඩි 200) සීමා කිරීම නිසා එය අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කිරීමට නොහැකි විය. ආයතනය විසින් නිරන්තරයෙන් කරන ලද ඉල්ලීම් වලට අනුව වර්ෂ 2022 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය UAV යානයේ උපරිම පියාසර උස අඩි 400 සඳහා අවසර ලබා දෙන ලදී.

ඒ වන විට යානයේ නිෂ්පාදකයා විසින් ලබා දෙන වගකීම් කාලය අවසන් වී තිබූ අතර UAV යානය ගුවන් ගත කිරීම සඳහා පියාසර සැලැස්ම සකස් කිරීමේදී, UAV යානයේ පියාසර සැලසුම් පද්ධතියට අදාල මෘදුකාංගයේ දෝෂයක් නිරීක්ෂණය විය. මෙම දෝෂය සහිතව යානය ගුවන්ගත කිරීමට නොහැකි බැවින් එම දෝෂය නිවැරදි කර ගැනීම සඳහා යානය නිෂ්පාදනය කළ සමාගම සමඟ අපට විද්‍යුත් තැපැල භාවිතා කර ගනිමින් සම්බන්ධ වීමට හැකි විය. නමුත්, එම අවස්ථාවේ දී මෙම යානය නිෂ්පාදනය කළ සමාගම වෙනත් සමාගමකට විකුණා ඇති බවත්, මුල් සමාගම විසින් භාවිතා කළ ඉහතින් සඳහන් කල මෘදුකාංගය ත වදුරටත් නව සමාගම විසින් තම නිෂ්පාදන සඳහා භාවිතා නොකරන බැවින් ඉහත දෝෂය නිවැරදි කර දීමට ඔවුන්ට හැකියාවක් නොමැති බවත් අපට දැනුම් දෙන ලදී. කෙසේ වෙතත්, මේ වන විට අප ආයතනයේ තාක්ෂණික අංශ වල සහය ඇතිව UAV යානයේ පවතින මෘදුකාංග දෝෂය නිවැරදි කිරීමට ප්‍රයත්නයක් දරමින් සිටිමු.

(ඇ) විගණන නිරීක්ෂණයේ සඳහන් ලැබිය යුතු / ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා ඇති 1,775,825 ක අගය පාලන ගිණුමය. මෙම පාලන ගිණුම් භාණ්ඩාගාර ලැබීම් ගිණුම සහ ව්‍යාපෘති හා පාඨමාලා පාලන ගිණුම පවත්වාගෙන යන්නේ අරමුදල් කළමනාකරණය කර ගැනීමේ උපාය මාර්ගික මෙවලමක් ලෙසය. එකී පාලන ගිණුම් 2කේ ශේෂයන් මූල්‍ය ප්‍රකාශන අවසන් දිනට එකිනෙක සමපාත වේ. ඒ අනුව මෙම ගිණුම්වල නිවැරදිතාවය පිළිබඳ ගැටලුවක් ඇති නොවේ.
ගිණුම්කරණ මූල ධර්ම වලට අනුව හර ශේෂයක අගය බැර ශේෂයක අගයක් හා පියවීම මගින් එකී ගිණුම්වල අගයන් අනාවරණයක් සිදු නොවන බව අපගේ නිරීක්ෂණයයි.

(ඇ) විගණන නිරීක්ෂණයේ සඳහන් තොග අයිතම වලින් වැඩි ප්‍රමාණයක් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල ඉලෙක්ට්‍රොනික අයිතම වන අතර ඒවා ව්‍යාපෘතිවල ස්වභාවය අනුව කාලයෙන් කාලයට භාවිතයට ගැනීමේ අවශ්‍යතාවන් මතුවේ. එමෙන්ම එකී ඉලෙක්ට්‍රොනික අයිතම විවෘත වෙළඳපොලෙන් සෘජුව මිලදී ගැනීමට හැකියාවක්, පවත්නා ආර්ථික අර්බුද තත්වය මත නොමැති වී ඇත. එමනිසා සංවර්ධන හා පර්යේෂණ අවශ්‍යතා අනුව තොග අයිතම පවත්වා ගැනීම සිදු කළ යුතු වේ. එම තාක්ෂණික සහ ඉලෙක්ට්‍රොනික අයිතම දැනට වෙළඳපොලෙන් මිලට ගැනීමට සිදුවුවහොත් එම මිල මීට වඩා කිහිප ගුණයක් වන බැවින් ව්‍යාපෘතිවල ස්වභාවය හා අවශ්‍යතාවය පරිදි එම තොග පවත්වාගෙන යාමට සිදුවී ඇත.

අත්සන් කලේ,
ඉංජිනේරු ආචාර්ය සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරි
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය